# ترجمة معاني جزء عم

تشرف بإصدارها باللغة السنهالية:

## شعبة توعية الجاليات في الزلفي

**الطبعة الأولى : ٩/١٤٢٤هـ.**


ح  شعبة توعية الجاليات بالزلفي ، ١٤٢٤ هـ

*فهرسة مكتبة الملك فهد الوطنية أثناء النشر*

ترجمة شعبة توعية الجاليات بالزلفي
ترجمة معاني جزء عم / ترجمة شعبة توعية الجاليات بالزلفي
الزلفي ، ١٤٢٤ هـ
٧٢ ص : ١٤,٥ X ٢١,٥ سم

ردمك : ٣ - ٤٣ - ٨٦٤ - ٩٩٦٠

(النص باللغة السنهالية)

١- القرآن - جزء عم - ترجمة - اللغة السنهالية    أ- العنوان
ديوي ٢٢١،٤٩    ١٤٢٤/٥٥٠٢

رقم الإيداع: ١٤٢٤/٥٥٠٢
ردمك : ٣-٤٣-٨٦٤-٩٩٦٠

**الصف والإخراج: شعبة توعية الجاليات في الزلفي**

بسم الله الرحمن الرحيم

تشرف بإصدار هذه الترجمة


**شعبة توعية الجاليات بالزلفي**

**وزارة الشؤون الاسلامية والأوقاف والدعوة والإرشاد**

الزلفي١١٩٣٢ - المنطقة الصناعية - ص.ب: ١٨٢

ت: ٠٦٤٢٢٥٦٥٧ - فاكس: ٤٢٢٤٢٣٤

حساب الطباعة: ١/٦٩٦٠ - الحساب العام: ٣/٦٩٥٩

شركة الراجحي المصرفية - فرع الزلفي



**حقوق الطبع محفوظة**

لا يسمح بطبع أي من مطبوعاتنا إلا للتوزيع المجاني فقط.

بشرط عدم التصرف في أي شيء عدا شكل الغلاف الخارجي



## විදේශිකයින් මගපෙන්වීම් කාර්යාලය
## අල් සුල්ෆි-11932, සෞදි අරේබියාව

*Foreigners Guidance Office,*
*P.O Box : 182, Al Zulfi-11932, K.S.A.*
*Tel : 06/4225657, Fax : 06/4224234*



මෙම ප්‍රකාශනය නොමිලේ බෙදාහැරීම සඳහා පමණක් කිසිඳු වෙනස් කිරීමකින් තොරව මුද්‍රණය කළ හැක.

# පටුන - محتويات


| පරිච්ඡේදය | පිටුව |
|---|---|
| 1-අල් ෆාතිහා | 1 |
| 2-අන් නබඋ | 2 |
| 3-අන්නාසිආත් | 6 |
| 4-අබස | 10 |
| 5-අත්තක්වීර් | 13 |
| 6-අල් ඉන්ෆිතාර් | 16 |
| 7-අල් මුතෆ්ෆිෆීන් | 18 |
| 8-අල් ඉන්ෂිකාක් | 22 |
| 9-අල් බුරූජ් | 25 |
| 10-අත්තාරික් | 28 |
| 11-අල් අඃලා | 30 |
| 12-අල් ගාෂියා | 32 |
| 13-අල් ෆජ්ර් | 34 |
| 14-අල් බලද් | 37 |
| 15-අෂ්ෂම්ස් | 39 |
| 16-අල් ලෛල් | 41 |
| 17-අල්ලුහා | 43 |
| 18-අෂ්ෂරහ් | 44 |
| 19-අත්තීන් | 45 |
| 20-අල් අලක් | 46 |
| 21-අල් කද්ර් | 48 |
| 22-අල් බයියිනා | 49 |
| 23-අල් සිල්සාල් | 51 |
| 24-අල් ආදියාත් | 52 |
| 25-අල් කාරිආ | 53 |
| 26-අත්තකාසුර් | 54 |
| 27-අල් අස්ර් | 55 |
| 28-අල් හුමසා | 56 |
| 29-අල් ෆීල් | 57 |
| 30-කුරෛෂ් | 58 |
| 31-අල් මාඌන් | 59 |
| 32-අල් කව්සර් | 60 |
| 33-අල් කාෆිරූන් | 61 |
| 34-අන්නස්ර් | 62 |
| 35-අල් මසද් | 63 |
| 36-අල් ඉහ්ලාස් | 64 |
| 37-අල් ෆලක් | 65 |
| 38-අන්නාස් | 66 |

| سورة | صفحة |
|---|---|
| ١ - الفاتحة | ١ |
| ٢ - النبأ | ٢ |
| ٣ - النازعات | ٦ |
| ٤ - عبس | ١٠ |
| ٥ - التكوير | ١٣ |
| ٦ - الإنفطار | ١٦ |
| ٧ - المطففين | ١٨ |
| ٨ - الإنشقاق | ٢٢ |
| ٩ - البروج | ٢٥ |
| ١٠ - الطارق | ٢٨ |
| ١١ - الأعلى | ٣٠ |
| ١٢ - الغاشية | ٣٢ |
| ١٣ - الفجر | ٣٤ |
| ١٤ - البلد | ٣٧ |
| ١٥ - الشمش | ٣٩ |
| ١٦ - الليل | ٤١ |
| ١٧ - الضحى | ٤٣ |
| ١٨ - الشرح | ٤٤ |
| ١٩ - التين | ٤٥ |
| ٢٠ - العلق | ٤٦ |
| ٢١ - القدر | ٤٨ |
| ٢٢ - البينة | ٤٩ |
| ٢٣ - الزلزال | ٥١ |
| ٢٤ - العاديات | ٥٢ |
| ٢٥ - القارعة | ٥٣ |
| ٢٦ - التكاثر | ٥٤ |
| ٢٧ - العصر | ٥٥ |
| ٢٨ - الهمزة | ٥٦ |
| ٢٩ - الفيل | ٥٧ |
| ٣٠ - قرسش | ٥٨ |
| ٣١ - الماعون | ٥٩ |
| ٣٢ - الكوثر | ٦٠ |
| ٣٣ - الكافرون | ٦١ |
| ٣٤ - النصر | ٦٢ |
| ٣٥ - المسد | ٦٣ |
| ٣٦ - الإخلاص | ٦٤ |
| ٣٧ - الفلق | ٦٥ |
| ٣٨ - الناس | ٦٦ |

# سورة الفاتحة
# පළමු වෙනි වෙළුම

| පරිච්ඡේදය : 1<br>අල් ෆාතිහා - ආරම්භය<br>වැකි : 7 - මක්කී | ١– سورة الفاتحة<br>مكية سبع آيات |
|---|---|
| 1-අසීමිත කරුණාවන්ත අසම දයා වන්ත අල්ලාහ්ගේ නාමයෙන් (ආරම්භ කරමි.) | ١ - بِسْمِ ٱللَّهِ ٱلرَّحْمَـٰنِ ٱلرَّحِيمِ |
| 2-සියළුම ප්‍රසංශා සකල ලොවැසියන් ගේ ස්වාමියා* වූ අල්ලාහ්ටමය. | ٢-ٱلْحَمْدُ لِلَّهِ رَبِّ ٱلْعَـٰلَمِينَ |
| 3-(ඔහු) අසීමිත කරුණා වන්තයාය. අසම දයාවන්තයාය. | ٣-ٱلرَّحْمَـٰنِ ٱلرَّحِيمِ |
| 4-විනිශ්චය දිනයෙහි අධිපති (ඔහුමය) | ٤-مَـٰلِكِ يَوْمِ ٱلدِّينِ |
| 5-(අප ස්වාමිනී!) අප ඔබම නමදිමු. ඔබගෙන්ම අප උදව් පතමු. | ٥-إِيَّاكَ نَعْبُدُ وَإِيَّاكَ نَسْتَعِينُ |
| 6-ඔබ අපව ඍජු මාර්ගයෙහි ගමන් කරවනු මැනව! | ٦-ٱهْدِنَا ٱلصِّرَٰطَ ٱلْمُسْتَقِيمَ |
| 7-කවුරුන්හට ඔබ අනුග්‍රහයන් පහළ කළේද එවැන්නන්ගේ (එම) මග (හි ගමන් කරවනු මැනව) (එසේ ඔබගේ) කෝපයට ලක්වූවන් (වන්ගේ මග) ද නොමග ගියවුන්(ගේ මග)ද නොවේ. | ٧- صِرَٰطَ ٱلَّذِينَ أَنْعَمْتَ عَلَيْهِمْ غَيْرِ ٱلْمَغْضُوبِ عَلَيْهِمْ وَلَا ٱلضَّآلِّينَ |

# ٣٠ . جزء عم
# 30 වෙනි වෙළුම - ජුස්උ අම්ම

| | |
|---|---|
| පරිච්ඡේදය : 78<br>**අන් නබඋ - පුවත**<br>වැකි : 40- මක්කී | **٧٨- سورة النبأ**<br>**مكية وهي أربعون آية** |

| | |
|---|---|
| **අසීමිත කරුණාවන්ත අසම දයාවන්ත අල්ලාහ්ගේ නාමයෙන් (ආරම්භ කරමි)** | بِسۡمِ ٱللَّهِ ٱلرَّحۡمَٰنِ ٱلرَّحِيمِ |
| 1-(නබි!) කුමක් ගැන ඔවුන් එකිනෙකා ප්‍රශ්න කරමින් සිටින්නෝද ? | ١-عَمَّ يَتَسَآءَلُونَ |
| 2-ඉමහත් වූ එම පුවත ගැන- | ٢-عَنِ ٱلنَّبَإِ ٱلۡعَظِيمِ |
| 3-ඒ (පුවත) ගැන ඔවුන් විපමතා වී සිටින්නෝය. | ٣-ٱلَّذِي هُمۡ فِيهِ مُخۡتَلِفُونَ |
| 4-එසේ නොව, ඔවුන් ඉතා ඉක්මනින් දැනගන්නෝය. | ٤- كَلَّا سَيَعۡلَمُونَ |
| 5-පසුව. එසේ නොව, ඔවුන් ඉතා ඉක් -මනින් දැනගන්නෝය | ٥-ثُمَّ كَلَّا سَيَعۡلَمُونَ |
| 6-අප, මෙම භූමිය ඇතිරිල්ලක්* ලෙස නොකෙළෙමුද ? | ٦-أَلَمۡ نَجۡعَلِ ٱلۡأَرۡضَ مِهَٰدٗا |
| 7-තවද, කඳු, කාදැති ලෙසද (අප නොකෙළෙමුද ?) | ٧-وَٱلۡجِبَالَ أَوۡتَادٗا |
| 8-අප ඔබලාව (ගැහැණු, පිරිමි) ජෝඩු ලෙස නිර්මාණය කළෙමු | ٨- وَخَلَقۡنَٰكُمۡ أَزۡوَٰجٗا |
| 9-තවද, අප ඔබලාගේ නින්ද විවේක යක් ලෙස කළෙමු. | ٩-وَجَعَلۡنَا نَوۡمَكُمۡ سُبَاتٗا |
| 10-තවද රාත්‍රිය ඔබලාට පොරෝන යක් ලෙස කළෙමු. | ١٠-وَجَعَلۡنَا ٱلَّيۡلَ لِبَاسٗا |
| 11-අප දවාල ජීවන(යට අවශ්‍ය දේ සොයාගන්නා) කාලය කළෙමු | ١١-وَجَعَلۡنَا ٱلنَّهَارَ مَعَاشٗا |

| | |
|---|---|
| 12-ඔබලාට ඉහළින් ශක්තිමත් (අහස්) සතක් අපම ඇති කළමු. | ١٢-وَبَنَيْنَا فَوْقَكُمْ سَبْعًا شِدَادًا |
| 13-තවද, දීප්තිමත් පහනක් (වූ සූර්ය -යා) ද ඇති කළෙමු. | ١٣-وَجَعَلْنَا سِرَاجًا وَهَّاجًا |
| 14-වැසි වලාකුළුවලින් අධික වශයෙන් (වැටෙන) ජලයද පහළ කළෙමු | ١٤-وَأَنزَلْنَا مِنَ ٱلْمُعْصِرَٰتِ مَآءً ثَجَّاجًا |
| 15-එමගින් ධාන්‍යය ද, පැළෑටි ද අප බැහැර කිරීම සඳහා- | ١٥-لِّنُخْرِجَ بِهِۦ حَبًّا وَنَبَاتًا |
| 16-තවද, (අතු සහිත) ගස්වලින් යුත් උයන්ද (බැහැර කිරීම සඳහාද එම ජලය පහළ කළෙමු.) | ١٦-وَجَنَّٰتٍ أَلْفَافًا |
| 17-නියතව, විනිශ්ච දිනය වේලාව නියම කළ දෙයක්ම වන්නේය. | ١٧-إِنَّ يَوْمَ ٱلْفَصْلِ كَانَ مِيقَٰتًا |
| 18-සූර් (නම්වූ නලාව) පිඹිනු ලබන දවසෙහි ඔබලා කණ්ඩායම් වශ යෙන් පැමිණෙන්නෙහුය. | ١٨-يَوْمَ يُنفَخُ فِى ٱلصُّورِ فَتَأْتُونَ أَفْوَاجًا |
| 19-තවද අහස විවෘත වී, පසුව එය බොහෝ දොරටු ලෙස වන්නේය. | ١٩- وَفُتِحَتِ ٱلسَّمَآءُ فَكَانَتْ أَبْوَٰبًا |
| 20-තවද කඳු (ස්ථානවලින්) ඉවත්කර වනු ලැබ මිරිගු මෙන් වන්නේය. | ٢٠-وَسُيِّرَتِ ٱلْجِبَالُ فَكَانَتْ سَرَابًا |
| 21-නියතව නිරය (මෙම පව්කරුවන් ගැන) බලාපොරොත්තුවෙන් සිටින ස්ථානයක් වන්නේය. | ٢١-إِنَّ جَهَنَّمَ كَانَتْ مِرْصَادًا |
| 22-සීමාව ඉක්මවූ අයට නැවතුම් ස්ථා -නය වන්නේය | ٢٢-لِّلطَّٰغِينَ مَـَٔابًا |
| 23-එහි ඔවුන් යුග බොහෝමයක් නැවතී සිටින්නන් ලෙස සිටින තත්වයේ- | ٢٣-لَّٰبِثِينَ فِيهَآ أَحْقَابًا |
| 24-එහි ඔවුන් සිසිලක් හෝ පානයක් රස නොවිඳින්නෝය. | ٢٤-لَّا يَذُوقُونَ فِيهَا بَرْدًا وَلَا شَرَابًا |

٢٥-إِلَّا حَمِيمًا وَغَسَّاقًا

25-උච්ච ලෙස රත්කරන ලද (උණු) ජලයද වණ සැරවද හැර-

٢٦-جَزَآءً وِفَاقًا

26-(මෙය ඔවුන්ගේ කාර්යයනට) තිය-මිත කුලිය ලෙස,

٢٧-إِنَّهُمْ كَانُوا۟ لَا يَرْجُونَ حِسَابًا

27-නියතව, ඔවුන් (විනිශ්ච දිනයෙහි) විචාරණ විශ්වාසය නොකරන්නන් ලෙස සිටියහ.

٢٨-وَكَذَّبُوا۟ بِـَٔايَـٰتِنَا كِذَّابًا

28-තවද අපගේ වැකියන්ව අධික ලෙස බොරු කරමින් සිටියහ

٢٩-وَكُلَّ شَىْءٍ أَحْصَيْنَـٰهُ كِتَـٰبًا

29-සියළු දේ (ඒ ගැන හොඳින් දැන ගෙන) එය අප ලේඛණයෙහි සට හන් කර ඇත්තෙමු.

٣٠-فَذُوقُوا۟ فَلَن نَّزِيدَكُمْ إِلَّا عَذَابًا

30-එබැවින් රස විඳින්න. වේදනාව හැර (අන් කිසිවක්) ඔබලාහට අප වැඩි නොකරන්නෙමු (යැයි කියවේ)

٣١-إِنَّ لِلْمُتَّقِينَ مَفَازًا

31-නියතව බිය බැතියනට (ස්වර්ග යට යාමේ) ජය වරම ඇත.

٣٢-حَدَآئِقَ وَأَعْنَـٰبًا

32-උයන්ද, මිදි ද (එහි ඇත.)

٣٣-وَكَوَاعِبَ أَتْرَابًا

33-(බිරියන් ලෙස) සම වයසේ පසුවන කන්‍යා ස්ත්‍රීන්ද (සිටිති.)

٣٤-وَكَأْسًا دِهَاقًا

34-පැන්වලින්ද පිරුණ කෝප්පද (ඇත)

٣٥-لَّا يَسْمَعُونَ فِيهَا لَغْوًا وَلَا كِذَّٰبًا

35-එ(ම ස්වර්ගයෙ)හි ඔවුන් අනවශ්‍ය කථාද, බොරුද නොඅසන්නෝය.

٣٦- جَزَآءً مِّن رَّبِّكَ عَطَآءً حِسَابًا

36-(මෙය) ඔබ ස්වාමියාගෙන් (හොඳ) කුලිය ලෙසද ගණනින් වූ දායාදය ලෙස ද (ලබා දී ඇත.)

٣٧-رَّبِّ ٱلسَّمَـٰوَٰتِ وَٱلْأَرْضِ وَمَا بَيْنَهُمَا ٱلرَّحْمَـٰنِ لَا يَمْلِكُونَ مِنْهُ خِطَابًا

37-අහස්, පොළොව තවද, මේ දෙක අතර වූ දෙයෙහි ස්වාමියා (ඔහුය.) (ඔහු) අසීමිත කරුණා වන්තයාය. ඔහු හමුවෙහි ඔවුන් කථා කිරීමට ශක්තිය නොලබන්නෝය.

٣٨-يَوْمَ يَقُومُ ٱلرُّوحُ وَٱلْمَلَٰٓئِكَةُ صَفًّا ۖ لَّا يَتَكَلَّمُونَ إِلَّا مَنْ أَذِنَ لَهُ ٱلرَّحْمَٰنُ وَقَالَ صَوَابًا

**38**-රූහ් (නම් වූ ජිබ්රයීල්)ද, මලාඉකාවරුන්ද පෙළට සිටගන්නා දවසෙහි අසීමිත කරුණාවන්තයා (වන අල්-ලාහ්) කවරෙකු හට අනුමැතිය දෙන්නේද ඔවුන් හැර අනෙක් අය කිසිවෙක් කථා නොකරන්නෝය. ඔහුද සාධාරණය පවසන්නේය.

٣٩-ذَٰلِكَ ٱلْيَوْمُ ٱلْحَقُّ ۖ فَمَن شَآءَ ٱتَّخَذَ إِلَىٰ رَبِّهِۦ مَـَٔابًا

**39**-(එම කාර්යයන් සිදුවන) එය සත්‍ය දවසකි. එහෙයින්, කවරෙක් අදහස් කරන්නේද ඔහු ස්වාමියා කෙරෙහි යන මාර්ගය අරගනිත්වා!

٤٠-إِنَّآ أَنذَرْنَٰكُمْ عَذَابًا قَرِيبًا يَوْمَ يَنظُرُ ٱلْمَرْءُ مَا قَدَّمَتْ يَدَاهُ وَيَقُولُ ٱلْكَافِرُ يَٰلَيْتَنِى كُنتُ تُرَٰبًۢا

**40**-තියතව සමීපවෙමින් පවතින වේදනාව ගැන අප ඔබලාට අවවාද කරන්නෙමු. මිනිසා තම දෑත් ඉදිරිපත් කළ දෙය එම දවසෙහි දකින්නේය. තවද ප්‍රතික්ෂේප කළ අය (එම දවසෙහි) “අහෝ විනාශය! මා පස් බවට පත්විය යුතුව තිබුණා නොවේද?” යැයි කියන්නේය.

පරිච්ඡේදය : 79

## අන්නාසිආත් - උදුරාගන්නන්

වැකි : 79- මක්කී

## ٧٨- سورة النازعات

مكية وهي ست وأربعون آية

**අසීමිත කරුණාවන්ත අසම දයාවන්ත අල්ලාහ්ගේ නාමයෙන් (ආරම්භ කරමි)**

بِسۡمِ ٱللَّهِ ٱلرَّحۡمَٰنِ ٱلرَّحِيمِ

١-وَٱلنَّٰزِعَٰتِ غَرۡقٗا

1-(පව්කරුවන්ගේ ප්‍රාණ) බලවත් ලෙස උදුරන්නන් (වන මලාඉකාවරුන්) කෙරෙහි සත්‍ය යෙන්ම-

٢-وَٱلنَّٰشِطَٰتِ نَشۡطٗا

2-(යහපත්ශීලීන්ගේ ප්‍රාණ) මෘදු ලෙස අත්පත් කරන්නන් (වන මලාඉකාවරුන්) කෙරෙහි සත්‍ය වශයෙන්ම-

٣-وَٱلسَّٰبِحَٰتِ سَبۡحٗا

3-ඉතා සීඝ්‍රයෙන් පිහිනා යන්නන් (වන මලාඉකාවරුන්) කෙරෙහි සත්‍ය වශයෙන්ම-

٤-فَٱلسَّٰبِقَٰتِ سَبۡقٗا

4-(අත්පත් කරපත් යහපත්ශීලීන්ගේ ප්‍රාණ අල්ලාහ් හමුවෙහි ගෙන යාමට) තරග වදිමින් පසුකරන්නන් (වන මලාඉකාවරුන්) කෙරෙහි ද සත්‍ය වශයෙන්ම-

٥-فَٱلۡمُدَبِّرَٰتِ أَمۡرٗا

5-සියළු කාර්යයන් (අල්ලාහ්ගේ අණ පරිදි) පාලනය කරන්නන් (වන මලාඉකාවරුන්) කෙරෙහි ද සත්‍ය වශයෙන්ම-

٦-يَوۡمَ تَرۡجُفُ ٱلرَّاجِفَةُ

6-(පළමු වතාවට නලාව පිඹූ කල-භූමිය) බලවත් සෙළවීමෙන් සෙළ වෙන එම දවසෙහි-

٧-تَتۡبَعُهَا ٱلرَّادِفَةُ

7-එයට පසුව පැමිණෙන දෙය (වන දෙවෙනි වතාවට නලාව පිඹීම) අනුගමනය කරයි.

٨-قُلُوبٞ يَوۡمَئِذٖ وَاجِفَةٌ

8-එදින (සමහර) හදවත් (තිගැස්සී) ගැස්සෙමින් පවතී.

٩-أَبۡصَٰرُهَا خَٰشِعَةٞ

9-(ගැස්සෙමින් පවතින) ඒවායේ බැලීම් (බියෙන්) පහත් වී පවතී.

10-නියතව අප (මරණයට පත්ව පසුව පණ දී) පළමු තත්වයට හරවනු ලබන්නෙමුද ? යැයි ඔවුන් අසති

١٠-يَقُولُونَ أَءِنَّا لَمَرْدُودُونَ فِي ٱلْحَافِرَةِ

11-අප දිරාපත්වී ඇටකටු ලෙස පත්වූ වත්ද ? (අපව පණ දී නැගිට්ට වනු -යේ. යැයි අසති.)

١١-أَءِذَا كُنَّا عِظَـٰمًا نَّخِرَةً

12-එකල එය පාඩු වූ හැරීමය යැයි ද ඔවුන් (සරදම් ලෙස) කියන්නෝය.

١٢-قَالُواْ تِلْكَ إِذًا كَرَّةٌ خَاسِرَةٌ

13-එහෙයින්, එය එකම එක (මහා) හඬකි.

١٣-فَإِنَّمَا هِيَ زَجْرَةٌ وَٰحِدَةٌ

14-එකල ඔවුන් (ප්‍රාණය ලැබී) පිටියක එක්රැස් වන්නෝය.

١٤-فَإِذَا هُم بِٱلسَّاهِرَةِ

15-(නබි!) මූසාගේ පුවත ඔබහට පැමි -ණියේද ?

١٥-هَلْ أَتَىٰكَ حَدِيثُ مُوسَىٰٓ

16-තුවා නම්වූ පිරිසිදු මිටියාවතෙහි ඔහුගේ ස්වාමියා ඔහුව අඬ ගැසූ කල-

١٦-إِذْ نَادَىٰهُ رَبُّهُۥ بِٱلْوَادِ ٱلْمُقَدَّسِ طُوًى

17-ඔබ ෆිර්අවුන් වෙත යන්න! නියතව ඔහු (පාප කිරිමෙහි) සීමාව ඉක්ම වූයේය.

١٧-ٱذْهَبْ إِلَىٰ فِرْعَوْنَ إِنَّهُۥ طَغَىٰ

18-එහෙයින්, ඔබ (විශ්වාසය කිරීමෙන්) පිරිසිදුවීමට ඔබට (කැමැත්ත) ඇත්ද? යැයි ඔබ අසන්න

١٨-فَقُلْ هَل لَّكَ إِلَىٰٓ أَن تَزَكَّىٰ

19-තවද, ඔබගේ ස්වාමියා දෙස යන මග මා ඔබට පෙන්වන්නෙමි; (එයට) පසුව ඔහුට ඔබ බියවන්නේය. (යැයි පවසන්න)

١٩-وَأَهْدِيَكَ إِلَىٰ رَبِّكَ فَتَخْشَىٰ

20-එහෙයින්, මහා විශාල සාධකය ඔහුට ඔහු පෙන්වූයේය.

٢٠-فَأَرَىٰهُ ٱلْأَيَةَ ٱلْكُبْرَىٰ

21-එකල ඔහු (මූසාවද, ඔහු ගෙන ආ දෙයද) බොරු කළේය. තවද. (ඔහු ගේ ස්වාමියාට) පිටුපෑවේය.

٢١-فَكَذَّبَ وَعَصَىٰ

22-පසුව ඔහු පසුබැස. (ඔහුට විරුද් -ධව කෝලාහල කිරීමට) උත්සාහ කළේය.

٢٢-ثُمَّ أَدْبَرَ يَسْعَىٰ

23-එහෙයින්, ඔහු (තම කණ්ඩායම) එක් රැස් කලේය. පසුව අඬගැසු -වේය.

٢٣-فَحَشَرَ فَنَادَىٰ

24-එකල, මා ඔබලාගේ උසස්වූ ස්වා -මියාය යැයි (ඔවුන් හට) පැවසූ වේය.

٢٤-فَقَالَ أَنَا۠ رَبُّكُمُ ٱلْأَعْلَىٰ

25-එහෙයින්, ඔහුව අල්ලාහ් එලොව හා මෙලොව වේදනාව මගින් අල්ලා ගත්තේය.

٢٥-فَأَخَذَهُ ٱللَّهُ نَكَالَ ٱلْءَاخِرَةِ وَٱلْأُولَىٰٓ

26-නියතව, මෙහි (අල්ලාහ්ට) බියවත් -නාට ඉගෙන ගතයුතු පාඩමක් ඇත.

٢٦-إِنَّ فِى ذَٰلِكَ لَعِبْرَةً لِّمَن يَخْشَىٰٓ

27-නිර්මාණයෙන් ඔබලා ඉතා දැඩි (අය) ද ? නැතිනම් අහසද ? එය ඔහු නිර්මාණය කලේය.

٢٧-ءَأَنتُمْ أَشَدُّ خَلْقًا أَمِ ٱلسَّمَآءُ ۚ بَنَىٰهَا

28-එහි මුදුන ඔහු එසෙව්වේය. පසුව එය සම කලේය.

٢٨-رَفَعَ سَمْكَهَا فَسَوَّىٰهَا

29-තවද ඔහු එහි රාත්‍රිය අන්ධකාරය කර, (සූර්යයා මගින් උදාවන) එහි දවාලෙහි ආලෝකය බැහැර කලේය.

٢٩-وَأَغْطَشَ لَيْلَهَا وَأَخْرَجَ ضُحَىٰهَا

30-තවද, එයට පසු ඔහු භූමිය දිග හැරියේය.

٣٠-وَٱلْأَرْضَ بَعْدَ ذَٰلِكَ دَحَىٰهَآ

31-එයින් එහි ජලයද, එහි (ඇති සතු -නට) තණ වර්ග ද ඔහු බැහැර කලේය.

٣١-أَخْرَجَ مِنْهَا مَآءَهَا وَمَرْعَىٰهَا

32-කඳුද ඔහු (භූමියෙහි කාදැති ලෙස) ස්ථිර කලේය.

٣٢-وَٱلْجِبَالَ أَرْسَىٰهَا

33-ඔබලාට ද, ඔබලාගේ සතුනට ද ප්‍රයෝජන වනු පිණිස (ඒවායත් මෙසේ කලේය.)

٣٣-مَتَٰعًا لَّكُمْ وَلِأَنْعَٰمِكُمْ

34-එහෙයින්, (වැළැක්විය නොහැකි අවසාන දවසෙහි) මහා විපැත්තිය පැමිණි කල-

٣٤-فَإِذَا جَآءَتِ ٱلطَّآمَّةُ ٱلْكُبْرَىٰ

35-එම දවසෙහි මිනිසා (ලොවෙහි) තමා උත්සාහ කල දෙය සිහිකර ගන්නේය.

٣٥-يَوْمَ يَتَذَكَّرُ ٱلْإِنسَٰنُ مَا سَعَىٰ

| | |
|---|---|
| 36-එකළ දකින්නන්ට නිරය (දකින තත්වයේ) බැහැර කරවනු ලැබේ | ٣٦-وَبُرِّزَتِ ٱلْجَحِيمُ لِمَن يَرَىٰ |
| 37-එබැවින් කවරෙක් සීමාව ඉක්මවා ගියේද- | ٣٧-فَأَمَّا مَن طَغَىٰ |
| 38-තවද මෙලෝ ජීවිතය තෝරා ගත්තේද- | ٣٨-وَءَاثَرَ ٱلْحَيَوٰةَ ٱلدُّنْيَا |
| 39-නියතව නිරයම (ඔහුගේ) නවා තැනය | ٣٩-فَإِنَّ ٱلْجَحِيمَ هِىَ ٱلْمَأْوَىٰ |
| 40-තවද, කවරෙක් තම ස්වාමියා හමු-වෙහි සිටගැනීම ගැන බියවී (තම) සිත පහත් ආශාවන්ගෙන් වළක්වා ගත්තේද- | ٤٠-وَأَمَّا مَنْ خَافَ مَقَامَ رَبِّهِۦ وَنَهَى ٱلنَّفْسَ عَنِ ٱلْهَوَىٰ |
| 41-නියතව ස්වර්ගය ඔහුගේ නවා තැනය. | ٤١-فَإِنَّ ٱلْجَنَّةَ هِىَ ٱلْمَأْوَىٰ |
| 42-(නබි! අවසාන දිනයෙහි) පැය කව-දාද නියම වනුයේ යැයි ඔවුන් ඔබ ගෙන් ප්‍රශ්න කරන්නෝය | ٤٢-يَسْـَٔلُونَكَ عَنِ ٱلسَّاعَةِ أَيَّانَ مُرْسَىٰهَا |
| 43-එය ගැන කීමට ඔබ හට දැනුම කොහින්ද ? (ඒ ගැන වූ පිළිතුර ඔබ නොදන්නේය. අල්ලාහ් පමණක් එය දන්නේය.) | ٤٣- فِيمَ أَنتَ مِن ذِكْرَىٰهَآ |
| 44-එහි අවසානය (ගැන වූ දැනුම) ඔබගේ ස්වාමියා හමුවෙහි පමණක් ඇත්තේය | ٤٤- إِلَىٰ رَبِّكَ مُنتَهَىٰهَآ |
| 45-නියතව, ඔබ, එය ගැන බියවන්-නන්ට අවවාද කරන්නාය | ٤٥- إِنَّمَآ أَنتَ مُنذِرُ مَن يَخْشَىٰهَا |
| 46-නියතව එය ඔවුන් දකින දව-සෙහි- සවසෙහි නැතිනම් එහි උදයෙහි හෝ ස්වල්ප වේලාවක් හැර ඔවුන් (මෙලොවෙහි) නැවතී නොසිටියෝය යැයි හැඟේ | ٤٦-كَأَنَّهُمْ يَوْمَ يَرَوْنَهَا لَمْ يَلْبَثُوٓا۟ إِلَّا عَشِيَّةً أَوْ ضُحَىٰهَا |

## පරිච්ඡේදය : 80
## අබස - අප්‍රසන්නතාවය
## වැකි 42- මක්කී

## ٨٠- سورة عبس
مكية وهي إثنان وأربعون آية

**අසීමිත කරුණාවන්ත අසම දයාවන්ත අල්ලාහ්ගේ නාමයෙන් (ආරම්භ කරමි)**

بِسۡمِ ٱللَّهِ ٱلرَّحۡمَٰنِ ٱلرَّحِيمِ

1-(අපගේ දූතයාවූ) ඔහු අප්‍රසන්නතා-වය පෙන්වූයේය; තවද (මුහුණ) හැරෙව්වේය.

١-عَبَسَ وَتَوَلَّىٰٓ

2-ඔහු හමුවට අන්ධයා පැමිණි කල-

٢-أَن جَآءَهُ ٱلۡأَعۡمَىٰ

3-(නබි! ඔබගේ හමුවට පැමිණි) ඔහු පවිත්‍රයෙකු වන්නේය, යන්න ඔබ දන්නෙහිද ?

٣-وَمَا يُدۡرِيكَ لَعَلَّهُۥ يَزَّكَّىٰٓ

4-නැතිනම් ඔහු (ඔබගේ උපදේශය) සිහිකර ගැනීම මගින් (ඔබගේ) උප-දේශය ඔහුට ඵලක්වන්න පිළිවන.

٤-أَوۡ يَذَّكَّرُ فَتَنفَعَهُ ٱلذِّكۡرَىٰٓ

5-(ඔබගේ උපදේශයේ) අවශ්‍යතාවය කවරෙක් උදාසීණ කරන්නේද-

٥-أَمَّا مَنِ ٱسۡتَغۡنَىٰ

6-ඔහු වෙනුවන් ඔබ අවධානය යොමු කරන්නේය.

٦-فَأَنتَ لَهُۥ تَصَدَّىٰ

7-නමුත්. (ඉස්ලාමය පිළිගෙන) ඔහු පවිත්‍ර නොවන්නේනම්. ඔබට (වරද) නොවේ.

٧-وَمَا عَلَيۡكَ أَلَّا يَزَّكَّىٰ

8-නමුත් කවරෙක් ඔබ හමුවට ඉක්මන්-වූවෙකු ලෙස පැමිණියේද-

٨-وَأَمَّا مَن جَآءَكَ يَسۡعَىٰ

9-ඔහු (අල්ලාහ්ට) බිය වන තත්වයේ (ඔබ හමුවට පැමිණි කල)-

٩-وَهُوَ يَخۡشَىٰ

10-එකල ඔහු ගැන ඔබ නොසැලකිලි-මත්ව සිටින්නේය.

١٠-فَأَنتَ عَنۡهُ تَلَهَّىٰ

11-එසේනොව! නියතව (කුර්ආනය වූ) මෙය උපදේශයකි.

١١-كَلَّآ إِنَّهَا تَذۡكِرَةٞ

12-එහෙයින් කවරෙක් (මෙමගින් ඍජු මාර්ගයෙහි යන්නට) කැමතිවන්නේ-ද ඔහු මෙය සිහි කරයි.

١٢-فَمَن شَآءَ ذَكَرَهُۥ

| | |
|---|---|
| 13-(මෙම පුස්තකය) කීර්තිමත් ලේඛ -ණයෙහි (සටහන්ව) ඇත. | ١٣-فِي صُحُفٍ مُّكَرَّمَةٍ |
| 14-උසස් කරනලද, පිරිසිදු කරනලද (ලේඛණයෙහි ඇත.) | ١٤-مَّرْفُوعَةٍ مُّطَهَّرَةٍ |
| 15-(මලාඉකාවරුන්වන) ලියන්නන්ගේ අත් මගින් (ලියවනු ලබයි.) | ١٥-بِأَيْدِي سَفَرَةٍ |
| 16-(ඔවුන්) කීර්තිමත් හොඳ අයවේ. | ١٦-كِرَامٍ بَرَرَةٍ |
| 17-(ප්‍රතික්ෂේප කරන) මිනිසා සාපයට ලක් වේවා! (ගුණමකු ලෙස) ඔහුව ප්‍රතික්ෂේප කරන්නා ලෙස සිටීමට කලේ කුමක්ද? | ١٧-قُتِلَ ٱلْإِنسَٰنُ مَآ أَكْفَرَهُۥ |
| 18-(ප්‍රතික්ෂේප කරන) ඔහුව (අල්ලාහ් වූ) ඔහු කුමකින් නිර්මාණය කලේ -ද? (යන්න ඔහු සිතා බැලුවේද ?) | ١٨-مِنْ أَيِّ شَيْءٍ خَلَقَهُۥ |
| 19-ඉන්ද්‍රිය බිජයකින් ඔහුව (අල්ලාහ් වූ) ඔහු නිර්මාණය කලේය; පසුව ඔහුට (අවශ්‍ය සියල්ල) ඔහු නිර්ණය කලේය. | ١٩-مِن نُّطْفَةٍ خَلَقَهُۥ فَقَدَّرَهُۥ |
| 20-පසුව ඔහුට (මවගේ කුසයේ සිට දරුවා බිහිවෙන) මාර්ගය ඔහු පහසු කලේය. | ٢٠-ثُمَّ ٱلسَّبِيلَ يَسَّرَهُۥ |
| 21-පසුව ඔහුව, ඔහු මරණයට පත් කර, ඔහුව මිනීවලෙහි කරන්නේය. | ٢١-ثُمَّ أَمَاتَهُۥ فَأَقْبَرَهُۥ |
| 22-පසුව තමා සිතන කල, ඔහුව (පණ දී) ඔහු නැගිට්වුවන්නේය. | ٢٢-ثُمَّ إِذَا شَآءَ أَنشَرَهُۥ |
| 23-එසේ නොව! (අල්ලාහ් වූ) ඔහු මොහුට අණ කල දේ මොහු ඉටු නොකලේය. | ٢٣-كَلَّا لَمَّا يَقْضِ مَآ أَمَرَهُۥ |
| 24-එහෙයින් මිනිසා තමාගේ ආහාරය දෙස (එය කෙසේ ලැබෙන්නේද යන වග) විමසා බලන්වා! | ٢٤-فَلْيَنظُرِ ٱلْإِنسَٰنُ إِلَىٰ طَعَامِهِۦٓ |
| 25-(එය ඇති කිරීමට) නියතව අපම (අහසෙහි සිට) ජලය බහුල වශයෙන් වැක්කෙරෙව්වෙමු. | ٢٥-أَنَّا صَبَبْنَا ٱلْمَآءَ صَبًّا |

| | |
|---|---|
| 26-පසුව, භූමිය පැලෙන ලෙස පලා- | ٢٦-ثُمَّ شَقَقْنَا ٱلْأَرْضَ شَقًّا |
| 27-පසුව, එයින් ධාන්‍යයන් රෝපනය කරන්නෙමු. | ٢٧-فَأَنۢبَتْنَا فِيهَا حَبًّا |
| 28-(මෙසේ) මිදි ද, එළවලු ද- | ٢٨-وَعِنَبًا وَقَضْبًا |
| 29-ඔලිව්ද, ඉඳි ද- | ٢٩-وَزَيْتُونًا وَنَخْلًا |
| 30-ගස්වලින් පිරුණු උයන්ද- | ٣٠-وَحَدَآئِقَ غُلْبًا |
| 31-පලතුරුද, තණ ද- | ٣١-وَفَٰكِهَةً وَأَبًّا |
| 32-(මේ සියල්ල) ඔබලාටද, ඔබලාගේ සතුන්ට ද ප්‍රයෝජන වීම පිණිස-(ඇති කළෙමු.) | ٣٢-مَّتَٰعًا لَّكُمْ وَلِأَنْعَٰمِكُمْ |
| 33-එබැවින් (කන් බිහිරිවන) බියකරු ශබ්දය පැමිණෙන කළ- | ٣٣-فَإِذَا جَآءَتِ ٱلصَّآخَّةُ |
| 34-එම දවසෙහි මිනිසා තම සොහො-යුරා හැර දුවන්නේය. | ٣٤-يَوْمَ يَفِرُّ ٱلْمَرْءُ مِنْ أَخِيهِ |
| 35-තම මවද, තම පියාද- | ٣٥-وَأُمِّهِۦ وَأَبِيهِ |
| 36-තම බිරියද, තම දරුවන්ද (හැර දුවන්නේය.) | ٣٦-وَصَٰحِبَتِهِۦ وَبَنِيهِ |
| 37-එම දවසෙහි එක් එක් මිනිසාට තම තමාගේ (දුක්බර) තත්වය සෑහේ. | ٣٧-لِكُلِّ ٱمْرِئٍ مِّنْهُمْ يَوْمَئِذٍ شَأْنٌ يُغْنِيهِ |
| 38-(නමුදු) එම දවසෙහි සමහර මුහුණු දීප්තිමත්ව (පවතී.) | ٣٨-وُجُوهٌ يَوْمَئِذٍ مُّسْفِرَةٌ |
| 39-සිනහවෙමින්, සතුටුවෙමින් (පවතී) | ٣٩-ضَاحِكَةٌ مُّسْتَبْشِرَةٌ |
| 40-තවද, එම දිනයෙහි සමහර මුහුණු මත දූවිලි පවතී. | ٤٠-وَوُجُوهٌ يَوْمَئِذٍ عَلَيْهَا غَبَرَةٌ |
| 41-(දුකෙන්) කළු අඳුර ඒවා වසමින් පවතී. | ٤١-تَرْهَقُهَا قَتَرَةٌ |
| 42-පව් කළ, ප්‍රතික්ෂේප කළ අය ඔවුන්-මය. | ٤٢-أُوْلَٰٓئِكَ هُمُ ٱلْكَفَرَةُ ٱلْفَجَرَةُ |

පරිච්ඡේදය : 81
## අත්තක්වීර් - ඇකකිලීම
වැකි : 29- මක්කී

## ٨١- سورة التكوير
مكية وهي تسع وعشرون آية

**අසීමිත කරුණාවන්ත අසම දයාවන්ත අල්ලාහ්ගේ නාමයෙන් (ආරම්භ කරමි)**

بِسْمِ ٱللَّهِ ٱلرَّحْمَٰنِ ٱلرَّحِيمِ

1-සූර්යයා (ගේ දීප්තිය නැතිකර) අකුලන කළ-
١-إِذَا ٱلشَّمْسُ كُوِّرَتْ

2-තාරකාවන් ද (දීප්තිය නැති වී) හැලෙන කළ-
٢-وَإِذَا ٱلنُّجُومُ ٱنكَدَرَتْ

3-කඳුද (භූමියෙහි සිට) ඉවත් කරවනු ලබන කළ-
٣-وَإِذَا ٱلْجِبَالُ سُيِّرَتْ

4-ගැබ්බර ඔටුවන්ද නොසලකා අත් හැර දමන කළ-
٤-وَإِذَا ٱلْعِشَارُ عُطِّلَتْ

5-වනසතුන්ද (මිනිසුන්ද අනෙක් සතුන් සමග) එක්රැස් කරන කළ-
٥-وَإِذَا ٱلْوُحُوشُ حُشِرَتْ

6-මුහුදු ගිනි අවුලුවන කළ-
٦-وَإِذَا ٱلْبِحَارُ سُجِّرَتْ

7-ප්‍රාණයන්ද එක්රැස් කරන කළ-
٧-وَإِذَا ٱلنُّفُوسُ زُوِّجَتْ

8-පණපිටින් වළලනු ලැබූ ගැහැණු (දරුවා) ප්‍රශ්න කරවනු ලබන කළ-
٨-وَإِذَا ٱلْمَوْءُۥدَةُ سُئِلَتْ

9-කුමණ වැරුද්දක් සඳහා ඇයව මරණු ලැබුවේද ? (යැයි ප්‍රශ්න කරන කළ)-
٩-بِأَيِّ ذَنۢبٍ قُتِلَتْ

10-(විනිශ්චය සඳහා මිනිසුන්ගේ) ක්‍රියා ලේඛණ විවෘත කරන කළ-
١٠-وَإِذَا ٱلصُّحُفُ نُشِرَتْ

11-අහසද (බෑ වී) ඉවත්කරන කළ-
١١-وَإِذَا ٱلسَّمَآءُ كُشِطَتْ

12-තිරයද බලවත්ව දල්වන කළ-
١٢-وَإِذَا ٱلْجَحِيمُ سُعِّرَتْ

13-ස්වර්ගයද (යහපත් ශීලීන් සඳහා) සමීපයට ගෙන එන කළ-
١٣-وَإِذَا ٱلْجَنَّةُ أُزْلِفَتْ

14-එක් එක් ආත්මාව තමා (ලොවෙහි කරමින්) ගෙන ආ දෙය හොඳින් දැන ගන්නේය.
١٤-عَلِمَتْ نَفْسٌ مَّآ أَحْضَرَتْ

15-පසු පසට ගොස් ඉවත් වී යන දෙය (වන ග්‍රහයන්) කෙරෙහි මා දිවුරමි.

١٥-فَلَآ أُقۡسِمُ بِٱلۡخُنَّسِ

16-ගමන් කරන, සැගවෙන (තාරකා වන් කෙරෙහිද,)

١٦-ٱلۡجَوَارِ ٱلۡكُنَّسِ

17-පසුපසට වී යන රාත්‍රිය කෙරෙහිද.

١٧-وَٱلَّيۡلِ إِذَا عَسۡعَسَ

18-පැහැදිලිවෙමින් එන අළුයම කෙරෙහි සත්‍ය වශයෙන්ම-

١٨-وَٱلصُّبۡحِ إِذَا تَنَفَّسَ

19-නියතව. (කුර්ආනයවූ) මෙය කීර්ති -මත් (ජිබ්රයීල් නම්වූ) දූත(යෙකු මගින් යවනු ලැබූ) කියමන වේ.

١٩-إِنَّهُۥ لَقَوۡلُ رَسُولٖ كَرِيمٖ

20-(ඔහු) ශක්ති වන්තයාය; අර්ෂෙහි හිමියා හමුවේ උසස් තරාතිරම් ඇත්තාය.

٢٠-ذِي قُوَّةٍ عِندَ ذِي ٱلۡعَرۡشِ مَكِينٖ

21-(විශ්වය වන) එහි (මලාඉකාවරුන් ගෙන්) අවනත කරවනු ලබන්නාය; බලවත් විශ්වාසයට ලක්වූ කෙනෙකි

٢١-مُّطَاعٖ ثَمَّ أَمِينٖ

22-(අපගේ දූතයාවූ) ඔබලාගේ මිතුරා සිහිවිකල් වූවෙකු නොවේ.

٢٢-وَمَا صَاحِبُكُم بِمَجۡنُونٖ

23-තවද, සැබැවින්ම (ජිබ්රයීල් වූ) ඔහුව පැහැදිලි පහත් අහසෙහි ඔහු දුටුවේය.

٢٣-وَلَقَدۡ رَءَاهُ بِٱلۡأُفُقِ ٱلۡمُبِينِ

24-ඔහු (ඔහුට දැනුම් දෙන) සැග වූ දේ ගැන (හෙළි කිරීමට) ලෝභීවන් -නෙකු ද නොවේ.

٢٤-وَمَا هُوَ عَلَى ٱلۡغَيۡبِ بِضَنِينٖ

25-මෙ(ම අල්කුර්ආන)ය එළවන ලද ෂෙයිතාන්ගේ කීමද නොවේ.

٢٥-وَمَا هُوَ بِقَوۡلِ شَيۡطَٰنٖ رَّجِيمٖ

26-එහෙයින් (සත්‍යය හැර දමා) ඔබලා කොහි යන්නෙහුද?

٢٦-فَأَيۡنَ تَذۡهَبُونَ

27-මෙය ලොවැසියනට උපදේශයක් හැර නොමැත.

٢٧-إِنۡ هُوَ إِلَّا ذِكۡرٞ لِّلۡعَٰلَمِينَ

28-ඔබලාගෙන් (ඍජු මාර්ගයෙහි) ස්ථිරවීමට අදහස් කරන්නන් හට (මෙය උපදේශයකි.)

٢٨-لِمَن شَآءَ مِنكُمْ أَن يَسْتَقِيمَ

29-තවද, සකල ලෝවැසියන්ගේ ස්වාමියාවූ අල්ලාහ් කැමති වූවහොත් හැර ඔබලා (උපදෙස් ලැබීමට) කැමති නොවන්නෙහුය.

٢٩-وَمَا تَشَآءُونَ إِلَّآ أَن يَشَآءَ ٱللَّهُ رَبُّ ٱلْعَٰلَمِينَ

## පරිච්ඡේදය : 82
## අල් ඉන්ෆිතාර් - පැළීම
### වැකි : 19- මක්කී

## ٨٢- سورة الإنفطار
### مكية وهي تسع عشرة آية

**අසීමිත කරුණාවන්ත අසම දයාවන්ත අල්ලාහ්ගේ නාමයෙන් (ආරම්භ කරමි)**

بِسۡمِ ٱللَّهِ ٱلرَّحۡمَٰنِ ٱلرَّحِيمِ

1-අහස පැලී යන කල-

١-إِذَا ٱلسَّمَآءُ ٱنفَطَرَتۡ

2-තාරකාවන්ද හැලී වැටෙන කල-

٢-وَإِذَا ٱلۡكَوَاكِبُ ٱنتَثَرَتۡ

3-මුහුදු (උතුරා එකක් සමග අනෙක) මිශ්‍ර කරවන කල-

٣-وَإِذَا ٱلۡبِحَارُ فُجِّرَتۡ

4-මිනී වලවල් විවෘත කරවන කල-

٤-وَإِذَا ٱلۡقُبُورُ بُعۡثِرَتۡ

5-එක් එක් ආත්මාව තමා පෙරටු කල දෙය ද පසු කල දෙය ද හොඳින් දැනගන්නේය.

٥-عَلِمَتۡ نَفۡسٞ مَّا قَدَّمَتۡ وَأَخَّرَتۡ

6-ඕ! මිනිසා: කීර්තිමත් වූ ඔබගේ ස්වාමියාට ද්‍රෝහි වීමට ඔබව රැවැට්වූවේ කුමක්ද?

٦-يَٰٓأَيُّهَا ٱلۡإِنسَٰنُ مَا غَرَّكَ بِرَبِّكَ ٱلۡكَرِيمِ

7-(ඔබේ ස්වාමියා වූ) ඔහු කවරෙක්ද නම්, ඔබව (ඉන්ද්‍රිය බිජයකින්) නිර් මාණයකර පසුව ඔබව නිසියාකා -රව කර (ඔබගේ හැඩය) සකස් කලේය.

٧-ٱلَّذِي خَلَقَكَ فَسَوَّىٰكَ فَعَدَلَكَ

8-කුමණ හැඩයෙහි ඔහු සිතුවේද (එහි) ඔබ (ගේ අවයවයන්)ව ඒකාබද්ධ කලේය.

٨-فِيٓ أَيِّ صُورَةٖ مَّا شَآءَ رَكَّبَكَ

9-මෙසේ වුවත්, ඔබලා කුලිය ප්‍රදානය කරන දවස බොරු කරන්නෙහුය.

٩-كَلَّا بَلۡ تُكَذِّبُونَ بِٱلدِّينِ

10-නියතව ඔබලා කෙරෙහි රැකබලා ගන්නන් (පත්කරවනු ලැබ) සිටින් -නෝය.

١٠-وَإِنَّ عَلَيۡكُمۡ لَحَٰفِظِينَ

| | |
|---|---|
| 11-(ඔවුහු, මලාඉකා වරුන්ගෙන් වූ) කීර්තිමත් ලේඛකයන්ය. | ١١-كِرَامًا كَـٰتِبِينَ |
| 12-ඔබලා කරන දෙය ඔවුන් දැන (සට හන් කර)ගන්නෝය. | ١٢-يَعْلَمُونَ مَا تَفْعَلُونَ |
| 13-නියතව හොඳ අය නයීම් (නම් වූ ස්වර්ගයෙ)හි සිටිති. | ١٣-إِنَّ ٱلْأَبْرَارَ لَفِى نَعِيمٍ |
| 14-තවද, නියතව අයහපත් අය නිර -යෙහි සිටිති. | ١٤-وَإِنَّ ٱلْفُجَّارَ لَفِى جَحِيمٍ |
| 15-කුලිය දෙනු ලබන දවසෙහි එහි ඔවුන් ඇතුළුවන්නෝය. | ١٥-يَصْلَوْنَهَا يَوْمَ ٱلدِّينِ |
| 16-තවද, ඔවුන් එයින් (පලා ගොස්) සැඟවී සිටීමට හැකි අයද නොවේ. | ١٦-وَمَا هُمْ عَنْهَا بِغَآئِبِينَ |
| 17-(ඕ! නබි:) කුලිය දෙනු ලබන දවස කුමක්ද කියා ඔබට දැන්වූයේ කුමක්ද ? | ١٧-وَمَآ أَدْرَىٰكَ مَا يَوْمُ ٱلدِّينِ |
| 18-පසුවද, කුලිය දෙනු ලබන දවස කුමක්ද කියා ඔබට දැන්වූයේ කුමක්ද? | ١٨-ثُمَّ مَآ أَدْرَىٰكَ مَا يَوْمُ ٱلدِّينِ |
| 19-කිසිම ආත්මාවක් (වෙනත්) ආත්මා -වකට කුමක් හෝ කිරීමට ශක්තිය නොලබන දවස (එම දවස වේ.) තවද, බලය (සියල්ල) එම දවසෙහි අල්ලාහ් සතුය. | ١٩-يَوْمَ لَا تَمْلِكُ نَفْسٌ لِّنَفْسٍ شَيْـًٔا وَٱلْأَمْرُ يَوْمَئِذٍ لِّلَّهِ |

## පරිච්ඡේදය : 83 -අල් මුතෆ්ෆිෆීන්
## කිරුම් මිනුම්වල අඩුකරන්නන්
වැකි : 36- මක්කී

## ٨٣- سورة المطففين
مكية وهي ست وثلاثون آية

**අසීමිත කරුණාවන්ත අසම දයාවන්ත අල්ලාහ්ගේ නාමයෙන් (ආරම්භ කරමි)**

بِسْمِ ٱللَّهِ ٱلرَّحْمَٰنِ ٱلرَّحِيمِ

1-කිරුම් මිනුම්වල (වංචා කර) අඩු කරන්නන්ට විපතමය.

١-وَيْلٌ لِّلْمُطَفِّفِينَ

2-ඔවුන් කවුරුන්ද නම්, (තමන් වෙනු වෙන්) මිනිසුන්ගෙන් මැන ලබාගන්නේනම්. පූර්ණව (මැන) ලබා ගනිති.

٢-ٱلَّذِينَ إِذَا ٱكْتَالُوا۟ عَلَى ٱلنَّاسِ يَسْتَوْفُونَ

3-(නමුත්) තමුන් ඔවුනට (එනම් අන් අයට) මැන දෙන විටද (අඩු කර, වංචා කර ඔවුනට) පාඩු කරති.

٣-وَإِذَا كَالُوهُمْ أَو وَّزَنُوهُمْ يُخْسِرُونَ

4-එවැන්නන්- නියතව තමන් (එලොවෙහි පණ දී) නැගිට්ටුවනු ලබන්නන් යන්න ගැන ඔවුන් සිතා බැලුවේ නැද්ද ?

٤-أَلَا يَظُنُّ أُو۟لَٰٓئِكَ أَنَّهُم مَّبْعُوثُونَ

5-ඉමහත් දවසක් වෙනුවෙන්-

٥- لِيَوْمٍ عَظِيمٍ

6-ලොවැසියන්ගේ ස්වාමියා හමුවෙහි මිනිසුන් සිටගන්නා දවස.

٦-يَوْمَ يَقُومُ ٱلنَّاسُ لِرَبِّ ٱلْعَٰلَمِينَ

7-එබැවින්, නියතව නපුරු අයගේ (සටහන්) පොත සිජ්ජීන් හි ඇත.

٧-كَلَّآ إِنَّ كِتَٰبَ ٱلْفُجَّارِ لَفِى سِجِّينٍ

8-(නබි!) සිජ්ජීන් යනු කුමක්ද කියා ඔබට දැන්වූයේ කුමක්ද?

٨-وَمَآ أَدْرَىٰكَ مَا سِجِّينٌ

9-(එය පව්කරුවන්ගේ ක්‍රියාවන්) සටහන්වූ පොතය.

٩- كِتَٰبٌ مَّرْقُومٌ

10-බොරු කරන්නන්ට එදිනයෙහි විපතය.

١٠-وَيْلٌ يَوْمَئِذٍ لِّلْمُكَذِّبِينَ

11-ඔවුන් කවුරුන්ද තම්, කුලිය දෙනු ලබන දවස බොරු කරන්නෝය.

١١-ٱلَّذِينَ يُكَذِّبُونَ بِيَوْمِ ٱلدِّينِ

12-සීමාව ඉක්මවූ පව්කාර එක් එක් -කෙනා හැර (අන් අය) එය බොරු නොකරන්නෝය.

١٢-وَمَا يُكَذِّبُ بِهِۦٓ إِلَّا كُلُّ مُعْتَدٍ أَثِيمٍ

13-ඔහු හට අපගේ වාක්‍යයන් කියවා පෙන්වූ කළ, (මෙය) පැරැන්නන්ගේ කට කථා යැයි ඔහු කියන්නේය.

١٣-إِذَا تُتْلَىٰ عَلَيْهِ ءَايَٰتُنَا قَالَ أَسَٰطِيرُ ٱلْأَوَّلِينَ

14-එසේනොව! ඔවුන් උපයා ගනිමින් සිටි දෙය ඔවුන්ගේ හදවත් මත මළ සේ බැඳුනේය.

١٤-كَلَّا ۖ بَلْ ۜ رَانَ عَلَىٰ قُلُوبِهِم مَّا كَانُوا۟ يَكْسِبُونَ

15-එසේ නොවේ: (විනිශ්චය සඳහා ගෙන එනු ලබන) එම දිනයෙහි නියතව ඔවුන් තමන්ගේ ස්වාමි-යාව (දැකීමේ භාග්‍යය) කෙරෙන් ආවරණය කරනු ලැබුවන්ය.

١٥-كَلَّآ إِنَّهُمْ عَن رَّبِّهِمْ يَوْمَئِذٍ لَّمَحْجُوبُونَ

16-පසුව, නියතව ඔවුන් නිරයෙහි ඇතුළුවන්නන්ය.

١٦-ثُمَّ إِنَّهُمْ لَصَالُوا۟ ٱلْجَحِيمِ

17-පසුව, (ඔවුන් හට) කුමක් ඔබලා බොරු කරමින් සිටියෙහු ද එය, මෙය ය යැයි කිය වේ.

١٧-ثُمَّ يُقَالُ هَٰذَا ٱلَّذِى كُنتُم بِهِۦ تُكَذِّبُونَ

18-එසේනොව! නියතව යහපත්ශීලීන් -ගේ සටහන් ලේඛණය ඉල්ලියියූන් හි ඇත්තේය.

١٨-كَلَّآ إِنَّ كِتَٰبَ ٱلْأَبْرَارِ لَفِى عِلِّيِّينَ

19-(නබි!) ඉල්ලියියූන් යනු කුමක්ද කියා ඔබට දැන්වූයේ කුමක්ද ?

١٩-وَمَآ أَدْرَىٰكَ مَا عِلِّيُّونَ

20-(එය ක්‍රියාවන්) සටහන්වූ පොතය.

٢٠-كِتَٰبٌ مَّرْقُومٌ

21-(අල්ලාහ් හමුවෙහි) සමීපවූවන්(වන මලාඉකාවරු) එය බලන්නෝය.

٢١-يَشْهَدُهُ ٱلْمُقَرَّبُونَ

22-නියතව යහපත්ශීලීන් නයීම් (නම් ස්වර්ගයෙ)හි සිටිති.

٢٢-إِنَّ ٱلْأَبْرَارَ لَفِى نَعِيمٍ

| | |
|---|---|
| 23-(උසස්) ආසන මත (හිඳිමින් ස්වර්ග යෙහි දර්ශණ) බලමින් සිටිති. | ٢٣-عَلَى ٱلۡأَرَآئِكِ يَنظُرُونَ |
| 24-ඔවුන්ගේ මුහුණුවල සෞභාග්‍ය යෙහි සතුට (නබි!) ඔබ දැනගන් -නෙහිය. | ٢٤-تَعۡرِفُ فِي وُجُوهِهِمۡ نَضۡرَةَ ٱلنَّعِيمِ |
| 25-මුද්‍රාව තබන ලද (මත් නොවන) මත් පැනින් ඔවුන් පොවනු ලබන් -නෝය. | ٢٥-يُسۡقَوۡنَ مِن رَّحِيقٖ مَّخۡتُومٍ |
| 26-එහි මුද්‍රාව කස්තුරියවේ. (එබැවින්) තවද (ඒ සඳහා) දිරිය ගන්නන් දිරිය ගන්න! | ٢٦-خِتَٰمُهُۥ مِسۡكٞۚ وَفِي ذَٰلِكَ فَلۡيَتَنَافَسِ ٱلۡمُتَنَٰفِسُونَ |
| 27-තවද එහි මිශ්‍රණය තස්නීම් වේ. | ٢٧-وَمِزَاجُهُۥ مِن تَسۡنِيمٍ |
| 28-(තස්නීම් නම්) උල්පත- (අල්ලාහ්ට) සමීපවූවන් එය පානය කරති. | ٢٨-عَيۡنٗا يَشۡرَبُ بِهَا ٱلۡمُقَرَّبُونَ |
| 29-නියතව වැරදිකරුවන් (ලොවෙහි) විශ්වාස වන්තයින් දැක, (විහිළු කරමින්) සිනාසෙන්නන්ව සිටියහ. | ٢٩-إِنَّ ٱلَّذِينَ أَجۡرَمُواْ كَانُواْ مِنَ ٱلَّذِينَ ءَامَنُواْ يَضۡحَكُونَ |
| 30-තවද, ඔවුන් සමීපයෙහි ගියේනම්, (සරදම් කරමින් තමන් අතරෙහි) එකිනෙකා ඇස්වලින් පෙන්නා ගන් -නෝය. | ٣٠-وَإِذَا مَرُّواْ بِهِمۡ يَتَغَامَزُونَ |
| 31-තවද, තම පවුල දෙස ආපසු යන් -නේ නම්, (තමන් කළ දෙය ගැන) සතුටුවූවන් ලෙස හැරුණන්නෝය. | ٣١-وَإِذَا ٱنقَلَبُوٓاْ إِلَىٰٓ أَهۡلِهِمُ ٱنقَلَبُواْ فَكِهِينَ |
| 32-(විශ්වාස වන්තයින් වූ) ඔවුන්ව මොවුන් දුටු කළ, නියතව මොවුන් නොමග ගියවුන්ය යැයි ද කියති. | ٣٢-وَإِذَا رَأَوۡهُمۡ قَالُوٓاْ إِنَّ هَٰٓؤُلَآءِ لَضَآلُّونَ |

**33**-තවද (විශ්වාසවන්තයින්වූ) ඔවුන් කෙරෙහි (ප්‍රතික්ෂේප කරන්නන්වූ) මොවුන් භාරකරුවන් ලෙස යවා නොමැත.

٣٣-وَمَآ أُرۡسِلُواْ عَلَيۡهِمۡ حَٰفِظِينَ

**34**-නමුත් (අවසාන දවස වූ) අද දින විශ්වාස වන්තයින් එම ප්‍රතික්ෂේප කරුවන් දැක සිනහ වෙත්තෝය.

٣٤-فَٱلۡيَوۡمَ ٱلَّذِينَ ءَامَنُواْ مِنَ ٱلۡكُفَّارِ يَضۡحَكُونَ

**35**-(උසස් වූ) ආසන මත හිඳිමින් (නොමග ගියවුන් ලබන වේදනාව) බලති.

٣٥-عَلَى ٱلۡأَرَآئِكِ يَنظُرُونَ

**36**-(එලොව) ප්‍රතික්ෂේප කළ අයට, ඔවුන් කරගෙන හුන් දෙයට (යුතු) කූලිය දෙනු ලැබුවේද ? (යැයි ද ඇසේ.)

٣٦-هَلۡ ثُوِّبَ ٱلۡكُفَّارُ مَا كَانُواْ يَفۡعَلُونَ

| | |
|---|---|
| පරිච්ඡේදය : 84<br>**අල් ඉන්ෂිකාක් – පිපිරීම**<br>වැකි : 25- මක්කී | **٨٤- سورة الإنشقاق**<br>**مكية وهي خمس وعشرون آية** |

**අසීමිත කරුණාවන්ත අසම දයාවන්ත අල්ලාහ්ගේ නාමයෙන් (ආරම්භ කරමි)**

بِسْمِ اللَّهِ الرَّحْمَٰنِ الرَّحِيمِ

1-අහස පිපිරී යන කල-

١-إِذَا ٱلسَّمَآءُ ٱنشَقَّتۡ

2-තම (ස්වාමියාගේ අණට කීකරුවීම) යුතුකම වන තත්වයේ තම ස්වාමි-යාගේ අණට (එම අහස) අවනත වන කල-

٢-وَأَذِنَتۡ لِرَبِّهَا وَحُقَّتۡ

3-තවද භූමිය ඇතිරී-

٣-وَإِذَا ٱلۡأَرۡضُ مُدَّتۡ

4-එය තම අභ්‍යන්තරයේ ඇති දේ බැහැර කර, එය හිස් වන කල-

٤-وَأَلۡقَتۡ مَا فِيهَا وَتَخَلَّتۡ

5-තම (ස්වාමියාගේ අණට කීකරුවීම) යුතුකම වන තත්වයේ තම ස්වාමි-යාගේ අණට (එම භූමිය) අවනත වන කල-

٥-وَأَذِنَتۡ لِرَبِّهَا وَحُقَّتۡ

6-ඕ! මිනිසා: ඔබ ඔබගේ ස්වාමියා හමුවට යන තෙක් (හොඳ හෝ නරක බොහෝ කාර්යයන්හි නිරත වී) දුෂ්කරතාවයෙන් උත්සාහ කර මින් සිටින්නෙහිය; පසුව (එලොවේ) ඔහුව ඔබ මුණගැසෙන්නාව සිටී.

٦-يَٰٓأَيُّهَا ٱلۡإِنسَٰنُ إِنَّكَ كَادِحٌ
إِلَىٰ رَبِّكَ كَدۡحٗا فَمُلَٰقِيهِ

7-එබැවින් (එදිනයෙහි) කවරෙකුට කවරෙකුගේ සටහන් ලේඛණය ඔහුගේ දකුණු අතෙහි දෙනු ලැබු වේද-

٧-فَأَمَّا مَنۡ أُوتِيَ كِتَٰبَهُۥ بِيَمِينِهِۦ

8-ඔහු ඉතා ලෙහෙසි ගණන් ලෙස ගණන් අසවනු ලබයි.

٨-فَسَوۡفَ يُحَاسَبُ حِسَابٗا يَسِيرٗا

9-තවද, ඔහු ප්‍රීතිමත්ව තමාගේ පාර්-ශවයේ අය වෙත හැරෙන්නේය.

٩-وَيَنقَلِبُ إِلَىٰٓ أَهۡلِهِۦ مَسۡرُورٗا

10-තවද කවරෙකුට කවරෙකුගේ සට හන් ලේඛණය ඔහුගේ කොන්දට පිටුපසින් දෙනු ලැබුවේද-

١٠-وَأَمَّا مَنْ أُوتِيَ كِتَٰبَهُۥ وَرَآءَ ظَهْرِهِۦ

11-ඔහු (තමාට විනාශය යැයි කියා) විනාශය යදින්නේය.

١١-فَسَوْفَ يَدْعُواْ ثُبُورًا

12-ඔහු නිරයෙහි ඇතුළුවන්නේය.

١٢-وَيَصْلَىٰ سَعِيرًا

13-(මක්නිසාද) නියතව ඔහු (ලොවෙ-හි) තමා සමග වූවන් සමග ඉතා ප්‍රීතිමත්ව සිටියේය.

١٣-إِنَّهُۥ كَانَ فِيٓ أَهْلِهِۦ مَسْرُورًا

14-නියතව ඔහු, (තම ස්වාමියා දෙස) ආපසු නොයන්නේය යැයි සිතා ගෙන සිටියේය.

١٤-إِنَّهُۥ ظَنَّ أَن لَّن يَحُورَ

15-එසේ නොව! නියතව ඔහුගේ ස්වා-මියා ඔහුව බලන්නාව සිටියේය.

١٥-بَلَىٰٓ إِنَّ رَبَّهُۥ كَانَ بِهِۦ بَصِيرًا

16-සවස් වරුවේ රතු පැහැ අහස කෙරෙහි මා දිවුරමි.

١٦-فَلَآ أُقْسِمُ بِٱلشَّفَقِ

17-රාත්‍රිය කෙරෙහිද, එය රැස්කර ගෙන සිටින දේ කෙරෙහිද,

١٧-وَٱلَّيْلِ وَمَا وَسَقَ

18-පූර්ණ චන්ද්‍රයා කෙරෙහිද (දිවුරමි)

١٨-وَٱلْقَمَرِ إِذَا ٱتَّسَقَ

19-(එක තත්වයක සිට තවත් තත්වය කට) නියතව ඔබලා ක්‍රමයෙන් නැග යන්නෙහුය.

١٩-لَتَرْكَبُنَّ طَبَقًا عَن طَبَقٍ

20-එබැවින්, (මෙය ප්‍රතික්ෂේප කරන) ඔවුනට කුමක්ද (සිදුවූයේ ?) ඔවුන් විශ්වාසය නොකරන්නෝය.

٢٠-فَمَا لَهُمْ لَا يُؤْمِنُونَ

21-තවද, ඔවුනට (මෙම) කුර්ආනය කියවා පෙන්වූ කළ (අල්ලාහ් හට) ඔවුන් හිස් පහත් (කරමින් සුජූද්) නොකරන්නෝය.

٢١-وَإِذَا قُرِئَ عَلَيْهِمُ ٱلْقُرْءَانُ لَا يَسْجُدُونَ ۩ سجدة

22-තවද, ප්‍රතික්ෂේප කරන්නන් (මෙම කුර්ආනය) බොරු කරති.

٢٢-بَلِ ٱلَّذِينَ كَفَرُواْ يُكَذِّبُونَ

23-තවද ඔවුන් (තම සිතෙහි රැස්කර) සගවා ඇති දේ අල්ලාහ් හොඳින් දන්නේය.

٢٣-وَٱللَّهُ أَعْلَمُ بِمَا يُوعُونَ

24-එහෙයින් (නබි!) පීඩා සහිත වේද -නාව මගින් ඔවුනට ඔබ සුභාරංචි පවසන්න.

٢٤-فَبَشِّرْهُم بِعَذَابٍ أَلِيمٍ

25-විශ්වාසය කරමින් යහපත් ක්‍රියා වන් කළෝද එවැන්නන් හැර; ඔවුනට නිමක් නැති (හොඳ) කුලිය ඇත.

٢٥-إِلَّا ٱلَّذِينَ ءَامَنُوا۟ وَعَمِلُوا۟ ٱلصَّٰلِحَٰتِ لَهُمْ أَجْرٌ غَيْرُ مَمْنُونٍ

පරිච්ඡේදය : 85
## අල් බුරූජ් - ග්‍රහයන්
වැකි : 22- මක්කී

٨٥- سورة البروج
مكية وهي إثنتان وعشرون آية

**අසීමිත කරුණාවන්ත අසම දයාවන්ත අල්ලාහ්ගේ නාමයෙන් (ආරම්භ කරමි)**

بِسۡمِ ٱللَّهِ ٱلرَّحۡمَٰنِ ٱلرَّحِيمِ

1-ග්‍රහයන්වලින් යුක්තවූ අහස කෙරෙහි සත්‍ය වශයෙන්ම!

١-وَٱلسَّمَآءِ ذَاتِ ٱلۡبُرُوجِ

2-ප්‍රතිඥා දුන් (අවසාන) දිනය කෙරෙ-හිද සත්‍ය වශයෙන්ම!

٢-وَٱلۡيَوۡمِ ٱلۡمَوۡعُودِ

3-සාක්ෂිකරු කෙරෙහිද, සාක්ෂි කිය වනු ලබන දේ කෙරෙහිද සත්‍ය වශයෙන්ම!

٣-وَشَاهِدٖ وَمَشۡهُودٖ

4-(ගිනි) අගල්වලට අයත් වූවන් ශාප යට ලක් වූහ.

٤-قُتِلَ أَصۡحَٰبُ ٱلۡأُخۡدُودِ

5-දැවෙන ද්‍රව්‍යවලින් යුත් (මහා අගල වූ) ගින්න.

٥-ٱلنَّارِ ذَاتِ ٱلۡوَقُودِ

6-එහි මත ඔවුන් හිඳගනිමින් සිටි කල-

٦-إِذۡ هُمۡ عَلَيۡهَا قُعُودٞ

7-විශ්වාස වන්තයින්ව ඔවුන් (ගිනි අගලට දමා වේදනා) කල දෙයට (ඔවුන්ම) සාක්ෂි කරුවන් ලෙස සිටියහ.

٧-وَهُمۡ عَلَىٰ مَا يَفۡعَلُونَ
بِٱلۡمُؤۡمِنِينَ شُهُودٞ

8-(සියල්ල) අභිභවන්නා, ප්‍රසංශාවට ලක්වන්නා වූ අල්ලාහ්ව ඔවුන් විශ්වාසය කල නිසා හැර (අන් කිසි වකට විශ්වාසවන්තයන් වූ) ඔවුන්ව ඔවුන් පළි නොගත්තෝය.

٨-وَمَا نَقَمُواْ مِنۡهُمۡ إِلَّآ أَن
يُؤۡمِنُواْ بِٱللَّهِ ٱلۡعَزِيزِ ٱلۡحَمِيدِ

9-ඔහු කවරෙක්ද නම්, අහස් සහ පොළොවෙහි රාජ්‍යය ඔහු සතුය; තවද අල්ලාහ් සියළු දේ කෙරෙහි සාක්ෂිකරුය.

٩-ٱلَّذِي لَهُۥ مُلۡكُ ٱلسَّمَٰوَٰتِ
وَٱلۡأَرۡضِۚ وَٱللَّهُ عَلَىٰ كُلِّ
شَيۡءٖ شَهِيدٌ

10-(එහෙයින්) නියතව විශ්වාස කළ පිරිමින්වද විශ්වාස කළ ගැහැණුන් වද (මෙසේ) පීඩාවට ලක්කර පසුව. ඔවුන් (පසුතැවිලිවී) සමාව නොඉල් -ලුවෝද එවැන්නන්ට නිරයේහි වේදනා ඇත. ඔවුනට (විශ්වාසවන් -තයින්ව ඔවුන් දැවූ ආකාරයට ගින්නෙන්) දවාලන වේදනාද ඇත.

١٠-إِنَّ ٱلَّذِينَ فَتَنُواْ ٱلْمُؤْمِنِينَ وَٱلْمُؤْمِنَٰتِ ثُمَّ لَمْ يَتُوبُواْ فَلَهُمْ عَذَابُ جَهَنَّمَ وَلَهُمْ عَذَابُ ٱلْحَرِيقِ

11-නියතව විශ්වාසය කරමින් යහපත් ක්‍රියාවන් කරන්නෝද එවැන්නන්ට ස්වර්ගයන් ඇත. ඒවායෙහි පහළින් ගංගා ගලා බසී. එය ඉමහත් ජය ග්‍රහණයකි.

١١-إِنَّ ٱلَّذِينَ ءَامَنُواْ وَعَمِلُواْ ٱلصَّٰلِحَٰتِ لَهُمْ جَنَّٰتٌ تَجْرِي مِن تَحْتِهَا ٱلْأَنْهَٰرُ ذَٰلِكَ ٱلْفَوْزُ ٱلْكَبِيرُ

12-(නබි!) නියතව ඔබගේ ස්වාමියා -ගේ ඇල්ලීම ඉතා දැඩිය.

١٢-إِنَّ بَطْشَ رَبِّكَ لَشَدِيدٌ

13-නියතව ඔහු (ඔවුන්ව) පළමුව නිර් මාණය කරන්නේය. (ඔවුන් මරණ යට පත්වූ පසුද ඔවුන්ව) ඔහු ගෙන එන්නේය.

١٣-إِنَّهُۥ هُوَ يُبْدِئُ وَيُعِيدُ

14-තවද ඔහු අතිශයින් සමා කරන් -නාය. බලවත්ව ස්නේහ කරන්නාය

١٤-وَهُوَ ٱلْغَفُورُ ٱلْوَدُودُ

15-අර්ෂ් හි හිමියාය. ඉමහත් කීර්ති යෙන් යුක්තවන්නාය.

١٥-ذُو ٱلْعَرْشِ ٱلْمَجِيدُ

16-තමා අදහස් කරන දෙය කරන් - නාය.

١٦-فَعَّالٌ لِّمَا يُرِيدُ

17-එම සේනාවන්හි පුවත (නබි!) ඔබ හට පැමිණියේද?

١٧-هَلْ أَتَىٰكَ حَدِيثُ ٱلْجُنُودِ

18-ෆිර්අවුන්ගේ හා සමූද්ගේ -

١٨-فِرْعَوْنَ وَثَمُودَ

19-නමුත්, ප්‍රතික්ෂේප කරන්නන් (කුර් -ආනය) බොරු කිරීමෙහි (නියැලී) සිටිති.

١٩-بَلِ ٱلَّذِينَ كَفَرُواْ فِي تَكْذِيبٍ

20-අල්ලාහ් ඔවුන්ව ඇතින් සිට වටකර -මින් සිටින්නේය.

٢٠-وَٱللَّهُ مِن وَرَآئِهِم مُّحِيطٌۢ

| | |
|---|---|
| 21-තමුත්, එය කීර්තිමත් කුර්ආනය වේ. | ٢١-بَلْ هُوَ قُرْءَانٌ مَّجِيدٌ |
| 22-ආරක්ෂා කරන ලද (ලව්හුල් මහ් -ෆූල් නම්) ලේඛණයෙහි (ඇත.) | ٢٢-فِي لَوْحٍ مَّحْفُوظٍ |

පරිච්ඡේදය : 86

## අත්තාරික් - පහන් තරුව

වැකි : 17- මක්කී

## ٨٦- سورة الطارق

مكية وهي سبع عشرة آية

**අසීමිත කරුණාවන්ත අසම දයාවන්ත අල්ලාහ්ගේ නාමයෙන් (ආරම්භ කරමි)**

بِسْمِ اللَّهِ الرَّحْمَٰنِ الرَّحِيمِ

1-අහස කෙරෙහිද, පහන් තරුව (වූ තාරික්) කෙරෙහිද සත්‍ය වශයෙන්ම

١-وَٱلسَّمَآءِ وَٱلطَّارِقِ

2-තාරික් යනු කුමක්ද යන්න ඔබට දැන්වූයේ කුමක්ද ?

٢-وَمَآ أَدۡرَىٰكَ مَا ٱلطَّارِقُ

3-එය දීප්තිමත් පහන් තරුවය.

٣-ٱلنَّجۡمُ ٱلثَّاقِبُ

4-එක් එක් ආත්මාවට (අපගෙන් නියම කරන ලද) භාර කරුවෙකු එය කෙරෙහි නැතිව නොවේ.

٤-إِن كُلُّ نَفۡسٍ لَّمَّا عَلَيۡهَا حَافِظٞ

5-එහෙයින් මිනිසා (තමා) කුමණ දෙය -කින් නිර්මාණය වූයේද යන්න ඔහු (සිතා)බලත්වා!

٥-فَلۡيَنظُرِ ٱلۡإِنسَٰنُ مِمَّ خُلِقَ

6-පනිමින් නික්මෙන ජලයෙන් ඔහු නිර්මාණය වූයේය.

٦-خُلِقَ مِن مَّآءٖ دَافِقٖ

7-එය (පිරිමියාගේ) කොඳු ඇටද (ස්ත්‍රී -යගේ පියොවුරුවලට ඉහලින්) පපුවේ ඇට අතරින්ද නික්මේ.

٧-يَخۡرُجُ مِنۢ بَيۡنِ ٱلصُّلۡبِ وَٱلتَّرَآئِبِ

8-නියතව ඔහු, ඔහුව නැවත ගෙන ඒමෙහි පුළුවන්කම ඇත්තාය.

٨-إِنَّهُۥ عَلَىٰ رَجۡعِهِۦ لَقَادِرٞ

9-සියළුම රහස් හෙළිවන්නා වූ එම දවසෙහි-

٩-يَوۡمَ تُبۡلَى ٱلسَّرَآئِرُ

10-(මිනිසා වූ) ඔහුට කිසියම් ශක්ති -යක් නොමැත. (ඔහුට) උදව් කරන් -නාද නොමැත.

١٠-فَمَا لَهُۥ مِن قُوَّةٖ وَلَا نَاصِرٖ

11-(නැවත, නැවත) වැසි වැස්සීමෙන් යුක්ත වූ අහස කෙරෙහි සත්‍ය වශ -යෙන්ම.

١١-وَٱلسَّمَآءِ ذَاتِ ٱلرَّجۡعِ

12-(පැලෑටි රෝපනය වීමට) පැලීමෙන් යුක්ත වූ භූමිය කෙරෙහි සත්‍ය වශ -යෙන්ම,

١٢-وَٱلْأَرْضِ ذَاتِ ٱلصَّدْعِ

13-නියතව මෙ(ම කුර්ආන)ය (සත්‍යය, අසත්‍යය) වෙන්කර දක්වන කීමවේ.

١٣-إِنَّهُۥ لَقَوْلٌ فَصْلٌ

14-තවද මෙය නිෂ්ඵල (වචනවලින්වූ) දෙයක් නොවේ.

١٤-وَمَا هُوَ بِٱلْهَزْلِ

15-නියතව. ඔවුන් (ඔබට එරෙහිව) කුමන්ත්‍රණ කරති.

١٥-إِنَّهُمْ يَكِيدُونَ كَيْدًا

16-මාද (ඔවුනට එරෙහිව) කුමන්ත්‍රණ කරන්නෙමි.

١٦-وَأَكِيدُ كَيْدًا

17-එබැවින් ප්‍රතික්ෂේප කරන්නන්ට ඔබ අවකාශය දෙන්න! ස්වල්පව ඔවුනට අවකාශය දෙන්න!

١٧-فَمَهِّلِ ٱلْكَٰفِرِينَ أَمْهِلْهُمْ رُوَيْدًۢا

පරිච්ඡේදය : 87

## අල් අ:ලා-ඉතා උසස්වන්තයා

වැකි : 19- මක්කී

٨٧- سورة الأعلى

مكيةوهي تسع عشرة آية

**අසීමිත කරුණාවන්ත අසම දයාවන්ත අල්ලාහ්ගේ නාමයෙන් (ආරම්භ කරමි)**

بِسْمِ ٱللَّهِ ٱلرَّحْمَٰنِ ٱلرَّحِيمِ

1-(නබි!) ඉතා උසස් වූ ඔබගේ ස්වාමියාගේ නාමය ඔබ සුවි ශුද්ධ කරන්න!

١-سَبِّحِ ٱسْمَ رَبِّكَ ٱلْأَعْلَى

2-ඔහු (සෑම දේ) නිර්මාණයකර පසුව (ඒවා) නිවැරදි කළේය.

٢-ٱلَّذِى خَلَقَ فَسَوَّىٰ

3-තවද ඔහු කවරෙක්ද නම්, ඔහු (ඒවාට අවශ්‍ය දේ සියල්ල) නිර්ණය කර පසුව (ඒවා ලබාගැනීමට) මග පෙන්වූයේය.

٣-وَٱلَّذِى قَدَّرَ فَهَدَىٰ

4-තවද ඔහු කවරෙක්ද නම්, ඔහු (සිවු පාවන්ට) තණකෑම බැහැර කළේය

٤-وَٱلَّذِىٓ أَخْرَجَ ٱلْمَرْعَىٰ

5-පසුව ඒවා වියළී ගිය කොළ රොඩු ලෙස කළේය.

٥-فَجَعَلَهُۥ غُثَآءً أَحْوَىٰ

6-(ඕ! නබි: අපගේ වාක්‍යයන්ව) අප ඔබව කියවන්නට සලස්වන්නෙමු; පසුව ඔබ අමතක නොකරන්නේය.

٦-سَنُقْرِئُكَ فَلَا تَنسَىٰٓ

7-අල්ලාහ් සිතූ දේ හැර; නියතව ඔහු දෘශ්‍යමාන දේ ද, අදෘශ්‍යමාන දේ ද හොඳින් දන්නේය.

٧-إِلَّا مَا شَآءَ ٱللَّهُ إِنَّهُۥ يَعْلَمُ ٱلْجَهْرَ وَمَا يَخْفَىٰ

8-තවද, ලෙහෙසි (මාර්ග)ය ඔබට පහසු කරන්නෙමු.

٨-وَنُيَسِّرُكَ لِلْيُسْرَىٰ

9-එබැවින්, උපදෙස් (ජනයාට) ප්‍රයෝජන වන්නේනම් ඔබ (උපදෙස්කර) සිහි කරන්න!

٩-فَذَكِّرْ إِن نَّفَعَتِ ٱلذِّكْرَىٰ

10-(අල්ලාහ්ට) බියවන්නා (මෙමගින්) උපදෙස් ලබයි.

١٠-سَيَذَّكَّرُ مَن يَخْشَىٰ

١١-وَيَتَجَنَّبُهَا ٱلْأَشْقَى

11- එහෙයින්, මහා අභාග්‍ය වන්තයා මෙයින් වැලකෙන්නේය.

١٢-ٱلَّذِى يَصْلَى ٱلنَّارَ ٱلْكُبْرَىٰ

12- ඔහු (නිරයේ) මහා ගින්නෙහි ඇතුළු වන්නේය.

١٣-ثُمَّ لَا يَمُوتُ فِيهَا وَلَا يَحْيَىٰ

13- පසුව, එහි ඔහු මරණයට පත්වන් -නේද නැත; ජීවත්වන්නේද නැත.

١٤-قَدْ أَفْلَحَ مَن تَزَكَّىٰ

14- පවිත්‍රවූ කෙනා සැබැවින්ම ජයග්‍රහ -ණය ලැබුවේය.

١٥-وَذَكَرَ ٱسْمَ رَبِّهِۦ فَصَلَّىٰ

15- තවද ඔහු තම ස්වාමියාගේ නාමය පවසා පසුව සලාතය* ඉටු කලේය.

١٦-بَلْ تُؤْثِرُونَ ٱلْحَيَوٰةَ ٱلدُّنْيَا

16- නමුත්, ඔබලා (එලොව ජීවිතය හැර දමා) මෙලොව ජීවිතය තෝරාගෙන සිටින්නෙහුය.

١٧-وَٱلْأَخِرَةُ خَيْرٌ وَأَبْقَىٰٓ

17- එහෙත් එලොව (ජීවිතය) වඩාත් ශ්‍රේෂ්ඨ හා ස්ථිරය.

١٨-إِنَّ هَـٰذَا لَفِى ٱلصُّحُفِ ٱلْأُولَىٰ

18- නියතව මෙය පෙරවූ පුස්තකවලද (ඇත.)

١٩-صُحُفِ إِبْرَٰهِيمَ وَمُوسَىٰ

19- ඉබ්‍රාහීම් හා මූසාට පහළවූ පුස්තක වලද (ඇත.)

## පරිච්ඡේදය : 88
## අල්ගාසියා-වටකරගන්නා දෙය
වැකි : 26- මක්කී

## ٨٨- سورة الغاسية
مكية وهي ست وعشرون آية

**අසීමිත කරුණාවන්ත අසම දයාවන්ත අල්ලාහ්ගේ නාමයෙන් (ආරම්භ කරමි)**

بِسۡمِ ٱللَّهِ ٱلرَّحۡمَٰنِ ٱلرَّحِيمِ

1-(නබි!) වටකරන්නා දෙය (වන අව-සාන දවසෙ)හි පුවත ඔබහට පැමි-ණියේද?

١-هَلۡ أَتَىٰكَ حَدِيثُ ٱلۡغَٰشِيَةِ

2-එදිනයෙහි (ඇතැම්) මුහුණු (නින්දා වට පත් වී) පහත් වෙමින් පවතී.

٢-وُجُوهٞ يَوۡمَئِذٍ خَٰشِعَةٌ

3-ඒවා (වැරදි දෙය හොඳ යැයි සිතා) කාර්යයන් ඉටුකළ ඒවාද, (ඒ වෙනුවෙන්) නිරත වී සිටි ඒවාද වේ.

٣-عَامِلَةٞ نَّاصِبَةٞ

4-දළු දමමින් නැගෙන ගින්නෙහි ඒවා ඇතුළු වන්නේය.

٤-تَصۡلَىٰ نَارًا حَامِيَةٗ

5-උණුවෙන උල්පතෙන් (ඔවුනට) ජලය පොවනු ලැබේ.

٥-تُسۡقَىٰ مِنۡ عَيۡنٍ ءَانِيَةٖ

6-(එහි) ඔවුන් හට කටු සහිත පැළැටි වලින් හැර (අන් දෙයක්) ආහාර නොමැත.

٦-لَّيۡسَ لَهُمۡ طَعَامٌ إِلَّا مِن ضَرِيعٖ

7-එය නොවඩවයි; ඔවුන්ගේ කුසගින්-නද නොතිවයි.

٧-لَّا يُسۡمِنُ وَلَا يُغۡنِي مِن جُوعٖ

8-(නමුත්) එදිනයෙහි (වෙනත්) සමහර මුහුණු පිබිදීමෙන් පවතී.

٨-وُجُوهٞ يَوۡمَئِذٖ نَّاعِمَةٞ

9-(මෙලොව) තමන් කළ උත්සාහය (හොඳ ඵලය දීම) ගැන තෘප්තියට පත් වී පවතී.

٩-لِّسَعۡيِهَا رَاضِيَةٞ

10-උසස් වූ ස්වර්ගයෙහි (ඒවා) ඇත.

١٠-فِي جَنَّةٍ عَالِيَةٖ

11-එහි නිෂ්ඵල කිසිම වචනයක් (ඒවා) සවන් නොදෙති.

١١-لَّا تَسۡمَعُ فِيهَا لَٰغِيَةٗ

12-එහි ගලමින් පවතින උල්පතක්ය.

١٢-فِيهَا عَيۡنٞ جَارِيَةٞ

| | |
|---|---|
| 13-එහි උසස් ආසන ඇත. | ١٣-فِيهَا سُرُرٌ مَّرْفُوعَةٌ |
| 14-(එහි පානය කිරීමට) තබන ලද කෝප්පද (ඇත.) | ١٤-وَأَكْوَابٌ مَّوْضُوعَةٌ |
| 15-පේළියට තබන ලද කොට්ටද- | ١٥-وَنَمَارِقُ مَصْفُوفَةٌ |
| 16-අතුරන ලද උසස් වූ ඇතිරිම් ද (ඇත.) | ١٦-وَزَرَابِيُّ مَبْثُوثَةٌ |
| 17-ඔටුවා කෙසේ නිර්මාණයවී ඇත්ද? යන්න ඔවුන් (විමසා) නොබලත් - නෝද? | ١٧-أَفَلَا يَنظُرُونَ إِلَى ٱلْإِبِلِ كَيْفَ خُلِقَتْ |
| 18-තවද. අහස දෙස - එය කෙසේ ඔසවා ඇත්ද ? (යන්නද,) | ١٨-وَإِلَى ٱلسَّمَآءِ كَيْفَ رُفِعَتْ |
| 19-කඳු දෙස - ඒවා කෙසේ සිටවා ඇත්ද ? (යන්නද,) | ١٩-وَإِلَى ٱلْجِبَالِ كَيْفَ نُصِبَتْ |
| 20-තවද (ඔවුන් වෙසෙන) භූමිය දෙස- එය කෙසේ අතුරා ඇත්ද? (යන්නද ඔවුන් සිතා බලන්නේ නැද්ද ?) | ٢٠-وَإِلَى ٱلْأَرْضِ كَيْفَ سُطِحَتْ |
| 21-එබැවින් (නබි!) උපදෙස් කරන්න! නියතව. ඔබ (ඔවුනට) උපදෙස් කරන්නා වේ. | ٢١- فَذَكِّرْ إِنَّمَآ أَنتَ مُذَكِّرٌ |
| 22-ඔවුන් කෙරෙහි ඔබ භාරකරුවෙකු නොවේ. | ٢٢-لَّسْتَ عَلَيْهِم بِمُصَيْطِرٍ |
| 23-නමුත්, කවරෙක් ඉවතලමින් ප්‍රතික් -ෂේප කරන්නේද- | ٢٣-إِلَّا مَن تَوَلَّىٰ وَكَفَرَ |
| 24-ඔහුව අල්ලාහ් බලවත් වේදනාවෙන් වේදනා කරන්නේය. | ٢٤-فَيُعَذِّبُهُ ٱللَّهُ ٱلْعَذَابَ ٱلْأَكْبَرَ |
| 25-නියතව. ඔවුන්ගේ ආපසු හැරීම අප දෙසය. | ٢٥-إِنَّ إِلَيْنَآ إِيَابَهُمْ |
| 26-පසුව නියතව ඔවුන්ගේ ගණන් ඇසීම අප සතුය. | ٢٦- ثُمَّ إِنَّ عَلَيْنَا حِسَابَهُم |

| පරිච්ඡේදය : 89<br>අල් ෆජ්ර් - අළුයම<br>වැකි : 30- මක්කී | ٨٩- سورة الفجر<br>مكية وهي ثلاثون آية |
|---|---|
| **අසීමිත කරුණාවන්ත අසම දයාවන්ත අල්ලාහ්ගේ නාමයෙන් (ආරම්භ කරමි)** | بِسْمِ اللَّهِ الرَّحْمَٰنِ الرَّحِيمِ |
| 1-අළුයම කෙරෙහි සත්‍ය වශයෙන්ම, | ١-وَٱلْفَجْرِ |
| 2-දස රාත්‍රී කෙරෙහි සත්‍ය වශයෙන්ම, | ٢-وَلَيَالٍ عَشْرٍ |
| 3-ඉරට්ටේ හා ඔත්තේ කෙරෙහි සත්‍ය වශයෙන්ම, | ٣-وَٱلشَّفْعِ وَٱلْوَتْرِ |
| 4-ගතවන රාත්‍රිය කෙරෙහිද සත්‍ය වශ-යෙන්ම, | ٤-وَٱلَّيْلِ إِذَا يَسْرِ |
| 5-මෙහි බුද්ධිමතුන්ට (තහවුරු වන) දිවුරුමක් තිබෙනවා නේද ? | ٥-هَلْ فِى ذَٰلِكَ قَسَمٌ لِّذِى حِجْرٍ |
| 6-ඔබගේ ස්වාමියා ආද් (සමාජය)ට කෙසේ කළේද ? යන්න ඔබ (සිතා) නොබැලුවේද ? | ٦-أَلَمْ تَرَ كَيْفَ فَعَلَ رَبُّكَ بِعَادٍ |
| 7-(ඔවුන්, බලවත් ශක්ති වන්තයින් වන) කුළුනුවලින් යුක්තවූ ඉරම් වැසියන්ය. | ٧-إِرَمَ ذَاتِ ٱلْعِمَادِ |
| 8-ඔවුන් මෙන් (ශක්ති වන්ත) සමාජ යක් (ලොවෙහි) කිසිම රටක නිර්මා-ණය නොවූහ. | ٨-ٱلَّتِى لَمْ يُخْلَقْ مِثْلُهَا فِى ٱلْبِلَٰدِ |
| 9-තවද, නිම්නයෙහි ගල්පර සැරුවන් වන සමූද් (වැසියන්)වද - | ٩-وَثَمُودَ ٱلَّذِينَ جَابُوا۟ ٱلصَّخْرَ بِٱلْوَادِ |
| 10-තවද (බලවත් සේනාවකින්) ඇණ වලින් යුක්ත වූ ෆිර්අවුන්වද (ඔබ-ගේ ස්වාමියා කුමක් කළේද යන්න ඔබ සිතා නොබැලුවේද ?) | ١٠-وَفِرْعَوْنَ ذِى ٱلْأَوْتَادِ |
| 11-ඔවුන් රටවල සීමාව ඉක්මවා ක්‍රියා කළෝය. | ١١-ٱلَّذِينَ طَغَوْا۟ فِى ٱلْبِلَٰدِ |

12-පසුව, ඒවායන්හි ඔවුන් කෝලාහල කිරීම වැඩි කළහ.

١٢-فَأَكۡثَرُواْ فِيهَا ٱلۡفَسَادَ

13-එහෙයින්, ඔබගේ ස්වාමියා ඔවුන් කෙරෙහි වේදනාවෙහි කසය දැම්මේය.

١٣-فَصَبَّ عَلَيۡهِمۡ رَبُّكَ سَوۡطَ عَذَابٍ

14-නියතව ඔබගේ ස්වාමියා (වහලුන්ගේ සියළු කාර්යය ගැන) අවධානය යොමු කරමින් සිටී.

١٤-إِنَّ رَبَّكَ لَبِٱلۡمِرۡصَادِ

15-එහෙයින් මිනිසා: ඔහුගේ ස්වාමියා ඔහුව සෝදිසි කර පසුව ඔහුව ගෞරවයට පත්කර ඔහුට අනුග්‍රහයන්ද පිරිනැමූ කළ, මාව මාගේ ස්වාමියා ගෞරවයට පත් කළේය යැයි කියයි.

١٥-فَأَمَّا ٱلۡإِنسَٰنُ إِذَا مَا ٱبۡتَلَىٰهُ رَبُّهُۥ فَأَكۡرَمَهُۥ وَنَعَّمَهُۥ فَيَقُولُ رَبِّيٓ أَكۡرَمَنِ

16-තවද (අල්ලාහ්) ඔහුව සෝදිසිකර, ඔහුගේ ජීවන අවශ්‍යතා දුෂ්කර තත්වයට පත්කළ විට එකළ, මාගේ ස්වාමියා මාව නින්දාවට පත් කළේය යැයි ඔහු පවසයි.

١٦-وَأَمَّآ إِذَا مَا ٱبۡتَلَىٰهُ فَقَدَرَ عَلَيۡهِ رِزۡقَهُۥ فَيَقُولُ رَبِّيٓ أَهَٰنَنِ

17-(කාර්යය) එසේ නොවේ! ඔබලා අනාථයාව ගෞරවය නොකරන්නෙහුය.

١٧-كَلَّاۖ بَل لَّا تُكۡرِمُونَ ٱلۡيَتِيمَ

18-දිළිඳුනට (ඔබලා ආහාර පාන නොදෙන්නා සේම අනෙක් අයවද) ආහාරපාන දෙන ලෙස දිරි නොගන්වන්නෙහුය.

١٨-وَلَا تَحَٰٓضُّونَ عَلَىٰ طَعَامِ ٱلۡمِسۡكِينِ

19-(අන් අයට) අයත් වූ සම්පත්ද එක්ව අනුභව කරන්නෙහුය.

١٩-وَتَأۡكُلُونَ ٱلتُّرَاثَ أَكۡلٗا لَّمّٗا

20-තවද ඔබලා සීමාව ඉක්මවා සම්පත් ප්‍රිය කරන්නෙහුය.

٢٠-وَتُحِبُّونَ ٱلۡمَالَ حُبّٗا جَمّٗا

21-එසේ නොව! භූමිය දූවිලි ලෙස පළ වන කළ-

٢١-كَلَّآ إِذَا دُكَّتِ ٱلۡأَرۡضُ دَكّٗا دَكّٗا

22-මලාඉකාවරු පේළි වශයෙන් සිටින කළ, ඔබගේ ස්වාමියාද පැමිණියේ නම්-

٢٢-وَجَآءَ رَبُّكَ وَٱلۡمَلَكُ صَفّٗا صَفّٗا

23-එදිනයෙහි නිරය ඉදිරියට ගෙන ආ කළ-එදිනයෙහි මිනිසා සිහි කර ගන්නේය; තවද. ඔහුට එම (දින යෙහි) සිහි කිරීම කෙසේ (ප්‍රයෝ - ජන) වේද?

٢٣-وَجِاْيٓءَ يَوۡمَئِذِۭ بِجَهَنَّمَۚ يَوۡمَئِذٖ يَتَذَكَّرُ ٱلۡإِنسَٰنُ وَأَنَّىٰ لَهُ ٱلذِّكۡرَىٰ

24-මාගේ (එලොව) ජීවිතය වෙනුවෙන් (යහකම්) මා පෙරටු කළ යුතුව තිබුණා නොවේ ද ? යැයි එකල මිනිසා පවසයි.

٢٤-يَقُولُ يَٰلَيۡتَنِي قَدَّمۡتُ لِحَيَاتِي

25-එබැවින්. එදිනයෙහි (අල්ලාහ කරන) වේදනාව මෙන් වෙන කිසිවෙක් වේදනා නොකරන්නේය.

٢٥-فَيَوۡمَئِذٖ لَّا يُعَذِّبُ عَذَابَهُۥٓ أَحَدٞ

26-තවද ඔහු බඳින්නාක් මෙන් වෙන කිසිවෙක් නොබඳින්නේය.

٢٦-وَلَا يُوثِقُ وَثَاقَهُۥٓ أَحَدٞ

27-(නමුත් එදිනයෙහි යහපත් ශීලීන් හට) ඕ! ශාන්තිය ලැබූ ආත්මාව:

٢٧-يَٰٓأَيَّتُهَا ٱلنَّفۡسُ ٱلۡمُطۡمَئِنَّةُ

28-ඔබ ඔබගේ ස්වාමියා කෙරෙහි සෑහීමට පත් වූ තත්වයේද, (ඔහු) ඔබ කෙරෙහි සෑහීමට පත් වූ තත් -වයේද නැවත එන්න!

٢٨- ٱرۡجِعِيٓ إِلَىٰ رَبِّكِ رَاضِيَةٗ مَّرۡضِيَّةٗ

29-ඔබ මාගේ. යහපත් වහලුන් අතර එක්වන්න!

٢٩-فَٱدۡخُلِي فِي عِبَٰدِي

30-තවද. ඔබ මාගේ ස්වර්ගයෙහි ඇතුළුවන්න! (යැයි අල්ලාහ් පවසන් -නේය.)

٣٠-وَٱدۡخُلِي جَنَّتِي

| | |
|---|---|
| පරිච්ඡේදය : 90<br>**අල් බලද් - නගරය**<br>වැකි : 20- මක්කී | **٩٠- سورة البلد**<br>**مكية وهي عشرون آية** |

**අසීමිත කරුණාවන්ත අසම දයාවන්ත අල්ලාහ්ගේ නාමයෙන් (ආරම්භ කරමි)**

بِسْمِ اللَّهِ الرَّحْمَٰنِ الرَّحِيمِ

1-මෙම (මක්කා) නගරය කෙරෙහි මා දිවුරමි.

١-لَآ أُقْسِمُ بِهَٰذَا ٱلْبَلَدِ

2-ඔබ මෙම නගරයෙහි (නිදහස්ව) නැවතී සිටින තත්වයේ,

٢-وَأَنتَ حِلُّۢ بِهَٰذَا ٱلْبَلَدِ

3-පියවරුන් කෙරෙහිද, (උපත් ලැබූ) දරුවන් කෙරෙහිද සත්‍ය වශයෙන්ම

٣- وَوَالِدٍ وَمَا وَلَدَ

4-සැබැවින්ම අප මිනිසාව දුෂ්කරතාව යෙහි (ඇත්තෙකු ලෙස) නිර්මාණය කළෙමු.

٤-لَقَدْ خَلَقْنَا ٱلْإِنسَٰنَ فِى كَبَدٍ

5-කිසිවෙකුවත් (දඬුවම් කිරීමට) තමා කෙරෙහි බලය නොලබන්නේය යැයි ඔහු සිතාගෙන සිටින්නේද ?

٥-أَيَحْسَبُ أَن لَّن يَقْدِرَ عَلَيْهِ أَحَدٌ

6-අසීමිත සම්පත් මා විනාශ කළෙමි යැයි ඔහු පවසයි.

٦-يَقُولُ أَهْلَكْتُ مَالًا لُّبَدًا

7-තමාව කිසිවෙක් නොදුටුවේ යැයි ඔහු සිතන්නේද ?

٧-أَيَحْسَبُ أَن لَّمْ يَرَهُۥٓ أَحَدٌ

8-ඔහුට අප ඇස් දෙකක් ඇති නොකෙළෙමුද ?

٨-أَلَمْ نَجْعَل لَّهُۥ عَيْنَيْنِ

9-තවද දිවක්ද, තොල් දෙකක්ද (ඇති නොකෙළෙමුද ?)

٩-وَلِسَانًا وَشَفَتَيْنِ

10-තවද (යහපත, අයහපතවූ) මාර්ග දෙකක් අප ඔහුට පෙන්වූයෙමු.

١٠-وَهَدَيْنَٰهُ ٱلنَّجْدَيْنِ

11-නමුත් ඔහු "අකබාව" පසු නොකළේය.

١١-فَلَا ٱقْتَحَمَ ٱلْعَقَبَةَ

12-(නබි!) අකබා යනු කුමක්ද යන්න ඔබට කුමක් දන්වන්නේද ?

١٢-وَمَآ أَدْرَىٰكَ مَا ٱلْعَقَبَةُ

13-(එය) වහලෙකු නිදහස් කිරීමය.

١٣-فَكُّ رَقَبَةٍ

١٤-أَوۡ إِطۡعَـٰمٞ فِي يَوۡمٖ ذِي مَسۡغَبَةٖ

14- නැතිනම්. කුසගින්නෙන් පසුවන දවසෙහි ආහාර පාන ලබා දීමය.

١٥-يَتِيمٗا ذَا مَقۡرَبَةٍ

15- ඥාති අනාථයෙකුට හෝ

١٦- أَوۡ مِسۡكِينٗا ذَا مَتۡرَبَةٖ

16- නැතිනම් (දිළිඳුකමින්) පොළොවෙහි සැරිසරණ දිළින්දෙකුට හෝ (ආහාර පාන ලබා දීමය.)

١٧-ثُمَّ كَانَ مِنَ ٱلَّذِينَ ءَامَنُواْ وَتَوَاصَوۡاْ بِٱلصَّبۡرِ وَتَوَاصَوۡاْ بِٱلۡمَرۡحَمَةِ

17- පසුව. විශ්වාසය කරමින්, ඉවසීමෙන් පරස්පර උපදෙස්කර කරුණාව මගින් පරස්පර උපදෙස් කර පැමිණෙන්නන් ගෙන් සිටිමද වේ.

١٨-أُوْلَـٰٓئِكَ أَصۡحَٰبُ ٱلۡمَيۡمَنَةِ

18- දකුණු පාර්ශවයෙහි සිටින්නන් එවැන්නන්ය.

١٩-وَٱلَّذِينَ كَفَرُواْ بِـَٔايَٰتِنَا هُمۡ أَصۡحَٰبُ ٱلۡمَشۡـَٔمَةِ

19- නමුත් කවුරුන් අපගේ වාක්‍යයන් ප්‍රතික්ෂේප කරන්නෝද, ඔවුන් වම් පාර්ශවයේ සිටින්නන්ය.

٢٠-عَلَيۡهِمۡ نَارٞ مُّؤۡصَدَةُۢ

20- ඔවුන් කෙරෙහි (සියළු පැතිවලින්) දල්වන ලද ගින්න ඇත.

පරිච්ඡේදය : 91

## අෂ් ෂම්ස් – ඉර

වැකි : 15- මක්කී

## ٩١- سورة الشمس

مكية وهي خمس عشرة آية

**අසීමිත කරුණාවන්ත අසම දයාවන්ත අල්ලාහ්ගේ නාමයෙන් (ආරම්භ කරමි)**

بِسْمِ اللَّهِ الرَّحْمَٰنِ الرَّحِيمِ

1-සූර්යයා කෙරෙහිද, එහි ආලෝකය කෙරෙහිද සත්‍ය වශයෙන්ම,

١-وَالشَّمْسِ وَضُحَاهَا

2-(පසුව) එය පසු පස එන චන්ද්‍රයා කෙරෙහිද සත්‍ය වශයෙන්ම,

٢-وَالْقَمَرِ إِذَا تَلَاهَا

3-(සූර්යයාගෙන්) දවාල තික්මෙන කළ එය කෙරෙහි සත්‍ය වශයෙන්ම.

٣-وَالنَّهَارِ إِذَا جَلَّاهَا

4-(එම දවාල) වසාගන්නා වූ රාත්‍රිය කෙරෙහිද සත්‍ය වශයෙන්ම,

٤-وَاللَّيْلِ إِذَا يَغْشَاهَا

5-අහස කෙරෙහිද, එය (තිසියාකාරව) සකස් කළ කෙනා කෙරෙහිද සත්‍ය වශයෙන්ම,

٥-وَالسَّمَاءِ وَمَا بَنَاهَا

6-භූමිය කෙරෙහිද, තවද එය ඇතිරූ කෙනා කෙරෙහිද සත්‍ය වශයෙන්ම.

٦-وَالْأَرْضِ وَمَا طَحَاهَا

7-ආත්මාව කෙරෙහිද, එය සැකසූ කෙනා කෙරෙහිද සත්‍ය වශයෙන්ම.

٧-وَنَفْسٍ وَمَا سَوَّاهَا

8-පසුව, (අල්ලාහ් වූ) ඔහු එයට එහි හොඳ හා නරක ගැන හැඟීම් ඇති කළේය.

٨-فَأَلْهَمَهَا فُجُورَهَا وَتَقْوَاهَا

9-කවරෙක් (ආත්මාව වූ) එය පාරි ශුද්ධ කරගත්තේද සැබැවින්ම ඔහු ජය ලැබුවේය.

٩-قَدْ أَفْلَحَ مَن زَكَّاهَا

10-නමුත් කවරෙක් එය (පාපයෙහි) වැද්දූවේද ඔහු සැබැවින්ම පරාජය වූයේය.

١٠-وَقَدْ خَابَ مَن دَسَّاهَا

11-සමූද් (සමාජයන්) තමන්ගේ අක්‍රමික තාවයෙන් (සාලිහ් ව) බොරු කළහ.

١١-كَذَّبَتْ ثَمُودُ بِطَغْوَاهَا

12-ඔවුන්ගෙන් අභාග්‍යවන්තයෙක් ඉක් -මන් වී ඉදිරියට පැමිණි කළ-

١٢-إِذِ انبَعَثَ أَشْقَاهَا

13-අල්ලාහ්ගේ දූතයා(වූ සාලිහ්) ඔවුන්
හට: මෙය අල්ලාහ්ගේ ඔටුදෙනය;
මෙයට ජලය බීමට (බාධා නොකර)
ඉඩ දෙන්නැයි පැවසීය.

١٣ -فَقَالَ لَهُمۡ رَسُولُ ٱللَّهِ نَاقَةَ
ٱللَّهِ وَسُقۡيَـٰهَا

14-නමුත් ඔවුන් ඔහුව බොරුකර එහි
නහරය කපා දැමූහ. එනිසා ඔවුන්
-ගේ මෙම පව හේතුකොට ගෙන
ඔවුන්ගේ ස්වාමියා ඔවුන් කෙරෙහි
වේදනාව පහළකර ඔවුන් සියල්ල
(විනාශ කර) නිවැරදි කළේය.

١٤ -فَكَذَّبُوهُ فَعَقَرُوهَا فَدَمۡدَمَ
عَلَيۡهِمۡ رَبُّهُم بِذَنۢبِهِمۡ فَسَوَّىٰهَا

15-එහි අවසානය ගැන ඔහු බිය
නොවීය.

١٥ -وَلَا يَخَافُ عُقۡبَـٰهَا

පරිච්ඡේදය : 92
## අල් ලෛල් - රාත්‍රිය
වැකි : 21- මක්කී

٩٢- سورة الليل
مكية وهي احدى وعشرون آية

**අසීමිත කරුණාවන්ත අසම දයාවන්ත අල්ලාහ්ගේ නාමයෙන් (ආරම්භ කරමි)**

بِسْمِ اللَّهِ الرَّحْمَٰنِ الرَّحِيمِ

1-තමාව (අන්ධකාරයෙන්) වසාගන්නා රාත්‍රිය කෙරෙහි සත්‍ය වශයෙන්ම.
١-وَٱلَّيۡلِ إِذَا يَغۡشَىٰ

2-ආලෝකය තික්මෙන දවාල කෙරෙහි -ද සත්‍ය වශයෙන්ම,
٢-وَٱلنَّهَارِ إِذَا تَجَلَّىٰ

3-පිරිමියාවද ගැහැණිවද නිර්මාණය කළ කෙනා කෙරෙහි ද සත්‍ය වශ -යෙන්ම.
٣-وَمَا خَلَقَ ٱلذَّكَرَ وَٱلۡأُنثَىٰٓ

4-නියතව ඔබලාගේ උත්සාහ විවිධය
٤-إِنَّ سَعۡيَكُمۡ لَشَتَّىٰ

5-එබැවින් කවරෙක් (දන්) දී, තම ස්වාමියාට බිය වී-
٥-فَأَمَّا مَنۡ أَعۡطَىٰ وَٱتَّقَىٰ

6-තවද හොඳ දෙය (ඒවා හොඳ බව) සහතික කරන්නේද-
٦-وَصَدَّقَ بِٱلۡحُسۡنَىٰ

7-ඔහු හට අප (ස්වර්ගයට යන මග) ලෙහෙසි කරන්නෙමු.
٧-فَسَنُيَسِّرُهُۥ لِلۡيُسۡرَىٰ

8-නමුදු කවරෙක් ලෝභීවෙමින් අල්ලාහ් ගෙන් තමාව අවශ්‍යතා නොවන් -නෙකු යැයි සිතන්නේද.
٨-وَأَمَّا مَنۢ بَخِلَ وَٱسۡتَغۡنَىٰ

9-තවද හොඳ දෙය බොරු කරන් -නේද.
٩-وَكَذَّبَ بِٱلۡحُسۡنَىٰ

10-ඔහුට දුෂ්කරතාවයට අයත් (නිර -යෙහි) මග ලෙහෙසි කරන්නෙමු.
١٠-فَسَنُيَسِّرُهُۥ لِلۡعُسۡرَىٰ

11-එහෙයින්, ඔහු (නිරයෙහි) වැටුන කළ ඔහුගේ සම්පත් ඔහුට ඵලක් නොදෙන්නේය.
١١-وَمَا يُغۡنِي عَنۡهُ مَالُهُۥٓ إِذَا تَرَدَّىٰٓ

12-යහමග පෙන්වීම නියතව. අප සතුය.
١٢-إِنَّ عَلَيۡنَا لَلۡهُدَىٰ

13-තවද පසු දෙය (වන එලොව)ද පෙර දෙය (වන මෙලොව)ද අප ගේය.
١٣-وَإِنَّ لَنَا لَلۡأٓخِرَةَ وَٱلۡأُولَىٰ

| | |
|---|---|
| 14-එහෙයින්, දළු දමමින් දැවෙන (නිර යෙහි) ගින්න ගැන මා ඔබලා හට අවවාද කරමි. | ١٤-فَأَنذَرْتُكُمْ نَارًا تَلَظَّىٰ |
| 15-මහා අභාග්‍යවන්තයා හැර (අන්) කිසිවෙක් එහි ඇතුළු නොවන්නේය. | ١٥-لَا يَصْلَىٰهَآ إِلَّا ٱلْأَشْقَى |
| 16-ඔහු කවරෙක්ද නම්, ඔහු (අපගේ වාක්‍යයන්) බොරු කර ඉවතලීම් කළේය. | ١٦-ٱلَّذِى كَذَّبَ وَتَوَلَّىٰ |
| 17-නමුත්. බිය බැති කෙනා එ(ම නිර යෙ)හි සිට ඈත් කරවනු ලබන්නේය | ١٧-وَسَيُجَنَّبُهَا ٱلْأَتْقَى |
| 18-(ඔහු කවරෙක්ද නම්) තමාව පවිත්‍ර කරගන්නා ලෙස තමාගේ සම්පත් (අල්ලාහ්ගේ මාර්ගයෙහි) වියදම් කරන්නේය. | ١٨-ٱلَّذِى يُؤْتِى مَالَهُۥ يَتَزَكَّىٰ |
| 19-(මිතිසුන්ගෙන්) කවුරුන් හට වුවද (තම දන්දීම මගින් ඵලය අපේක්ෂා කර) දෙනු ලබන කිසිම උපකාරයක් තමා හමුවෙහි නොමැත; | ١٩-وَمَا لِأَحَدٍ عِندَهُۥ مِن نِّعْمَةٍ تُجْزَىٰٓ |
| 20-ඉතා උසස් වූ තම ස්වාමියාගේ තෘප්තිය සොයා (ඔහු දන් දෙන්නේය) | ٢٠-إِلَّا ٱبْتِغَآءَ وَجْهِ رَبِّهِ ٱلْأَعْلَىٰ |
| 21-ඉතා ඉක්මතින් (එවැන්නා අල්ලාහ් -ගේ දායාදයෙන්) තෘප්තිමත් වේ. | ٢١-وَلَسَوْفَ يَرْضَىٰ |

## පරිච්ඡේදය : 93
## අල් ළුහා - පෙරවරුව
### වැකි : 11- මක්කී

**අසීමිත කරුණාවන්ත අසම දයාවන්ත අල්ලාහ්ගේ නාමයෙන් (ආරම්භ කරමි)**

1-පෙරවරුව කෙරෙහි සත්‍ය වශ-යෙන්ම,

2-වසාගන්නා රාත්‍රිය කෙරෙහි සත්‍ය වශයෙන්ම,

3-ඔබගේ ස්වාමියා ඔබව අත් නොහැරි-යේය. තවද අප්‍රසන්න නොකළේය.

4-තවද පසු දේ (වන එලොව) පෙර දේ (වන මෙලොව)ට වඩා ඔබට ශ්‍රේෂ්ඨය.

5-තවද ඔබගේ ස්වාමියා ඉතා ඉක මනින් ඔබට (උසස් තරාතිරම්) පිරි නමන්නේය; එකල ඔබ තෘප්තිමත් වේ.

6-(නබි!) ඔහු ඔබව අනාථයාව දැක, පසුව (ඔබහට) පිහිටවූයේ නැද්ද ?

7-තවද, ඔබව මග නොදන්නා කෙනෙ-කුව දැක, ඔහු (ඔබව) යහමගෙහි යොමු කළේය.

8-තවද ඔහු ඔබව අවශ්‍යතා ඇත්තෙ-කුව දැක, අවශ්‍යතා නොවන්නෙකු කළේය.

9-එබැවින් ඔබ, අනාථයාට අප්‍රසන්න නොවන්න!

10-යාචකයින්ව නොඑළවන්න!

11-තවද ඔබගේ ස්වාමියාගේ අනුග්‍ර-හයන් ගැන (අනෙක් අයට) දැනුම් දෙන්න!

## ٩٣- سورة الضحى
### مكية وهي احدى عشرة آية

بِسْمِ ٱللَّهِ ٱلرَّحْمَٰنِ ٱلرَّحِيمِ

١-وَٱلضُّحَىٰ

٢-وَٱلَّيْلِ إِذَا سَجَىٰ

٣-مَا وَدَّعَكَ رَبُّكَ وَمَا قَلَىٰ

٤-وَلَلْءَاخِرَةُ خَيْرٌ لَّكَ مِنَ ٱلْأُولَىٰ

٥-وَلَسَوْفَ يُعْطِيكَ رَبُّكَ فَتَرْضَىٰٓ

٦-أَلَمْ يَجِدْكَ يَتِيمًا فَـَٔاوَىٰ

٧-وَوَجَدَكَ ضَآلًّا فَهَدَىٰ

٨-وَوَجَدَكَ عَآئِلًا فَأَغْنَىٰ

٩-فَأَمَّا ٱلْيَتِيمَ فَلَا تَقْهَرْ

١٠-وَأَمَّا ٱلسَّآئِلَ فَلَا تَنْهَرْ

١١-وَأَمَّا بِنِعْمَةِ رَبِّكَ فَحَدِّثْ

| | |
|---|---|
| පරිච්ඡේදය : 94<br>**අශ් ශරහ් - පුළුල් කිරීම**<br>වැකි : 8- මක්කී | **٩٤- سورة الشرح**<br>**مكية وهي ثماني آيات** |

**අසීමිත කරුණාවන්ත අසම දයාවන්ත අල්ලාහ්ගේ නාමයෙන් (ආරම්භ කරමි)**

بِسۡمِ ٱللَّهِ ٱلرَّحۡمَٰنِ ٱلرَّحِيمِ

1-(නබි!) අප ඔබගේ සිත ඔබ වෙනු -වෙන් පුළුල් නොකෙළෙමුද ?

١-أَلَمۡ نَشۡرَحۡ لَكَ صَدۡرَكَ

2-තවද, අප ඔබගෙන් ඔබගේ බර පහත් කළෙමු.

٢-وَوَضَعۡنَا عَنكَ وِزۡرَكَ

3-එය, ඔබේ කොන්ද තමමින් තිබුණි.

٣-ٱلَّذِىٓ أَنقَضَ ظَهۡرَكَ

4-තවද, අප ඔබ වෙනුවෙන් ඔබගේ සිහි කිරීම (නම් කීර්තිය) උසස් කළෙමු.

٤-وَرَفَعۡنَا لَكَ ذِكۡرَكَ

5-එබැවින්, නියතව, දුෂ්කර තාවය සමග පහසුව ඇත.

٥-فَإِنَّ مَعَ ٱلۡعُسۡرِ يُسۡرًا

6-නියතව දුෂ්කරතාවය සමග පහසුව ඇත.

٦-إِنَّ مَعَ ٱلۡعُسۡرِ يُسۡرًا

7-එබැවින්, (වැඩ කටයුතුවලින්) ඔබ මිදුනු කළ, (අල්ලාහ්ගේ මාර්ගයෙහි) උත්සුක වන්න!

٧-فَإِذَا فَرَغۡتَ فَٱنصَبۡ

8-තවද ඉත සිතින් ඔබගේ ස්වාමියා දෙසට යොමු වන්න!

٨-وَإِلَىٰ رَبِّكَ فَٱرۡغَب

පරිච්ඡේදය : 95
## අත්තීන් - අත්ති ගෙඩිය
වැකි : 8- මක්කී

٩٥- سورة التين
مكية وهي ثماني آيات

**අසීමිත කරුණාවන්ත අසම දයාවන්ත අල්ලාහ්ගේ නාමයෙන් (ආරම්භ කරමි)**

بِسْمِ اللَّهِ الرَّحْمَٰنِ الرَّحِيمِ

1-අත්තික්කා කෙරෙහිද, ඔලිව් කෙරෙහිද සත්‍ය වශයෙන්ම,

١-وَٱلتِّينِ وَٱلزَّيْتُونِ

2-සිනායි කඳු කෙරෙහිද සත්‍ය වශයෙන්ම,

٢-وَطُورِ سِينِينَ

3-තවද අභය දෙන්නාවූ මෙම (මක්කා) නගරය කෙරෙහිද සත්‍යවශයෙන්ම.

٣-وَهَٰذَا ٱلْبَلَدِ ٱلْأَمِينِ

4-සැබැවින්ම. අප මිනිසාව ඉතාමත් ලක්ෂණ හැඩයෙන් නිර්මාණය කළෙමු.

٤-لَقَدْ خَلَقْنَا ٱلْإِنسَٰنَ فِىٓ أَحْسَنِ تَقْوِيمٍ

5-පසුව (ඔහුගේ කාර්යයන් හේතු කොටගෙන) ඔහුව පහත්වූවන්ගෙන් පහත්වූවෙකු කළෙමු.

٥-ثُمَّ رَدَدْنَٰهُ أَسْفَلَ سَٰفِلِينَ

6-කවුරුන් විශ්වාසකර, යහපත් ක්‍රියාවන් කරන්නෝද ඔවුන් හැර (යහපත් ශීලීන්වූ) ඔවුනට සදා අවසානයක් නොමැති හොඳ කුලිය ඇත.

٦-إِلَّا ٱلَّذِينَ ءَامَنُوا۟ وَعَمِلُوا۟ ٱلصَّٰلِحَٰتِ فَلَهُمْ أَجْرٌ غَيْرُ مَمْنُونٍ

7-එබැවින් (මෙයට) පසුව, විනිශ්චය දිනය ගැන ඔබ හමුවෙහි කුමක් බොරු කළ හැකිද ?

٧-فَمَا يُكَذِّبُكَ بَعْدُ بِٱلدِّينِ

8-විනිශ්ච කරුවන්ගෙන් අති ශ්‍රේෂ්ඨ විනිශ්චයකාර අල්ලාහ් නොවේද ?

٨-أَلَيْسَ ٱللَّهُ بِأَحْكَمِ ٱلْحَٰكِمِينَ

## පරිච්ඡේදය : 96
## අල් අලක් - ලේ කැටිය
වැකි : 19- මක්කී

## ٩٦- سورة العلق
مكية وهي تسع عشرة آية

**අසීමිත කරුණාවන්ත අසම දයාවන්ත අල්ලාහ්ගේ නාමයෙන් (ආරම්භ කරමි)**

1-(සියළු දේ) නිර්මාණය කළ ඔබගේ ස්වාමියාගේ නාමයෙන් කියවන්න.

2-අලක්* නම් වූ තත්වයෙහි සිට මිනිසාව නිර්මාණය කළේය.

3-කියවන්න: ඔබගේ ස්වාමියා ඉමහත් කීර්ති වන්තයාය.

4-ඔහු ලේඛනියෙන් ඉගැන්වූයේය.

5-මිනිසාට, ඔහු නොදන්නා සියළු දේ ඉගැන්වූයේය.

6-නමුත් නියතව, මිනිසා සීමාව ඉක්මවා යන්නේය.

7-ඔහු, තමාව (ස්වාමියා කෙරෙන්) අවශ්‍යතා නොවන්නෙකු යැයි දකින කළ-

8-නියතව ඔහුගේ ආපසු හැරීම ඔබගේ ස්වාමියා දෙසය.

9-බාධා කරන්නා වූ ඔහුව (නබි!) ඔබ දුටුවේද ?

10-වහලෙකුව ඔහු සළාතය ඉටුකරන කළ,

11-ඔහු යහ මගෙහි හිඳිමින්(ද, ඔහුව සළාතයෙන් වැළැක්වූ කෙනාව) ඔබ දුටුවේද ?

12-නැතිනම් ඔහු බිය බැතිභාවය මගින් අණ කර සිටියද,

13-ඔහු (ඔහුව) බොරු කර, මුහුණ හරවා ගත්තේය යන්න ඔබ දුටුවේද

بِسْمِ ٱللَّهِ ٱلرَّحْمَٰنِ ٱلرَّحِيمِ

١-ٱقْرَأْ بِٱسْمِ رَبِّكَ ٱلَّذِى خَلَقَ

٢-خَلَقَ ٱلْإِنسَٰنَ مِنْ عَلَقٍ

٣-ٱقْرَأْ وَرَبُّكَ ٱلْأَكْرَمُ

٤-ٱلَّذِى عَلَّمَ بِٱلْقَلَمِ

٥-عَلَّمَ ٱلْإِنسَٰنَ مَا لَمْ يَعْلَمْ

٦-كَلَّآ إِنَّ ٱلْإِنسَٰنَ لَيَطْغَىٰٓ

٧-أَن رَّءَاهُ ٱسْتَغْنَىٰٓ

٨-إِنَّ إِلَىٰ رَبِّكَ ٱلرُّجْعَىٰٓ

٩-أَرَءَيْتَ ٱلَّذِى يَنْهَىٰ

١٠-عَبْدًا إِذَا صَلَّىٰٓ

١١-أَرَءَيْتَ إِن كَانَ عَلَى ٱلْهُدَىٰٓ

١٢-أَوْ أَمَرَ بِٱلتَّقْوَىٰٓ

١٣-أَرَءَيْتَ إِن كَذَّبَ وَتَوَلَّىٰٓ

14-නියතව අල්ලාහ් (ඔහුව) බලන්නේය යන්න ඔහු නොදන්නේද ?

١٤-أَلَمْ يَعْلَم بِأَنَّ ٱللَّهَ يَرَىٰ

15-එසේනොව: ඔහු නොවැළැකෙන්නේ නම්, නියතව අප (ඔහුගේ) ඉදිරිපස නලල් කෙස් රොදින් අල්ලා ඔහුව අදින්නෙමු.

١٥-كَلَّا لَئِن لَّمْ يَنتَهِ لَنَسْفَعًۢا بِٱلنَّاصِيَةِ

16-වැරදිකර බොරු කියන්නාවූ (ඔහු -ගේ) ඉදිරිපස නලල් කෙස්.

١٦-نَاصِيَةٍ كَٰذِبَةٍ خَاطِئَةٍ

17-එබැවින් ඔහු තම කණ්ඩායම අඬ ගැසුවාවේ!

١٧-فَلْيَدْعُ نَادِيَهُۥ

18-අපද (දඬුවම් දෙන්නා වූ) ආරක්ෂ -කයින්ව අඬගසන්නෙමු.

١٨-سَنَدْعُ ٱلزَّبَانِيَةَ

19-එසේ නොව, ඔහුට ඔබ අවනත නොවන්න! (ඔබගේ ස්වාමියාට) සුජූද්* කර (ඔහුට) සමීපවන්න!

١٩-كَلَّا لَا تُطِعْهُ وَٱسْجُدْ وَٱقْتَرِب ۩

පරිච්ඡේදය : 97

## අල් කද්ර් - කීර්තිමත් දෙය

වැකි : 5- මක්කී

٩٧- سورة القدر

مكية وهي خمس آيات

**අසීමිත කරුණාවන්ත අසම දයාවන්ත අල්ලාහ්ගේ නාමයෙන් (ආරම්භ කරමි)**

بِسْمِ ٱللَّهِ ٱلرَّحْمَٰنِ ٱلرَّحِيمِ

1-නියතව අප එ(ම කුර්ආන)ය කීර්ති-මත් රාත්‍රිය (නම් ලෛලතුල් කද්ර්) හි පහළ කළෙමු.

١-إِنَّآ أَنزَلْنَٰهُ فِى لَيْلَةِ ٱلْقَدْرِ

2-තවද කීර්තිමත් රාත්‍රිය කුමක්ද යන්න ඔබට දැන්වූයේ කුමක්ද ?

٢-وَمَآ أَدْرَىٰكَ مَا لَيْلَةُ ٱلْقَدْرِ

3-කීර්තිමත් (එම) රාත්‍රිය දහස් මස-කට වඩා ශ්‍රේෂ්ඨය.

٣-لَيْلَةُ ٱلْقَدْرِ خَيْرٌ مِّنْ أَلْفِ شَهْرٍ

4-එහි මලාඉකාවරුන්ද, රූහ් (වූ ජිබ්රයීල්)ද තම ස්වාමියාගේ අනුමැතිය මත (සිදුවිය යුතු) සියළු කාර්යයන් පිණිස බසින්නෝය.

٤- تَنَزَّلُ ٱلْمَلَٰٓئِكَةُ وَٱلرُّوحُ فِيهَا بِإِذْنِ رَبِّهِم مِّن كُلِّ أَمْرٍ

5-(එම රාත්‍රියෙහි) ශාන්තිය (පවතී): එය අළුයම උදාවන තෙක් පවතී.

٥-سَلَٰمٌ هِىَ حَتَّىٰ مَطْلَعِ ٱلْفَجْرِ

## පරිච්ඡේදය : 98
## අල්බයියිනා-පැහැදිලි සාක්ෂිය
### වැකි : 8- මදනී

**අසීමිත කරුණාවන්ත අසම දයාවන්ත අල්ලාහ්ගේ නාමයෙන් (ආරම්භ කරමි)**

1-පුස්තකය හිමි අයවලුන් ගෙන්ද, සමාන කරන්නන් ගෙන්ද කවුරුන් ප්‍රතික්ෂේප කරන්නෝද, ඔවුන් තමන් හට පැහැදිලි සාක්ෂිය පැමි-ණෙන තෙක් (තම මාර්ගයෙහි සිට) ඉවත් වන අය නොවේ.

2-(එම පැහැදිලි සාක්ෂියනම්) අල්ලාහ් ගෙන් පැමිණි දූතයා ඔවුනට පිරිසිදු පුස්තකය කියවා පෙන්වන්නේය (යන්නය.)

3- එහි ස්ථිර නීති රීති ඇත.

4-නමුත් පුස්තකය හිමි අයවලුන් ඔවු-නට පැහැදිලි (මෙම) සාක්ෂිය පැමිණි පසුව හැර- ඔවුන් වෙන් නොවූහ.

5-අල්ලාහ්ට නැමදුම අමිශ්‍ර කළවුන් ලෙස, සියළු අසත්‍ය මාර්ගවලින් ඈත්වූවන් ලෙස, ඔවුන් අල්ලාහ්ව නැමදුම් කිරීමටද සලාතය ඔවුන් කිරීමටද සකාතය* ඔවුන් දීමටද හැර ඔවුන් අණකරවනු නොලැබූහ. තවද ඍජු මාර්ගය මෙයමය.

6-නියතව පුස්තකය හිමි අයවලුන් ගෙන්ද සමාන කරන්නන්ගෙන්ද කවුරුන් ප්‍රතික්ෂේප කරන්නෝද ඔවුන් නිර ගින්නයෙහිය. එහි සදා රැඳී සිටින්නෝය. එවැනි අය මැවුම් වලින් නපුරු අය වේ.

## ٩٨- سورة البينة
### مدنية وهي ثماني آيات

بِسۡمِ ٱللَّهِ ٱلرَّحۡمَٰنِ ٱلرَّحِيمِ

١-لَمۡ يَكُنِ ٱلَّذِينَ كَفَرُواْ مِنۡ أَهۡلِ ٱلۡكِتَٰبِ وَٱلۡمُشۡرِكِينَ مُنفَكِّينَ حَتَّىٰ تَأۡتِيَهُمُ ٱلۡبَيِّنَةُ

٢-رَسُولٞ مِّنَ ٱللَّهِ يَتۡلُواْ صُحُفٗا مُّطَهَّرَةٗ

٣-فِيهَا كُتُبٞ قَيِّمَةٞ

٤-وَمَا تَفَرَّقَ ٱلَّذِينَ أُوتُواْ ٱلۡكِتَٰبَ إِلَّا مِنۢ بَعۡدِ مَا جَآءَتۡهُمُ ٱلۡبَيِّنَةُ

٥-وَمَآ أُمِرُوٓاْ إِلَّا لِيَعۡبُدُواْ ٱللَّهَ مُخۡلِصِينَ لَهُ ٱلدِّينَ حُنَفَآءَ وَيُقِيمُواْ ٱلصَّلَوٰةَ وَيُؤۡتُواْ ٱلزَّكَوٰةَۚ وَذَٰلِكَ دِينُ ٱلۡقَيِّمَةِ

٦-إِنَّ ٱلَّذِينَ كَفَرُواْ مِنۡ أَهۡلِ ٱلۡكِتَٰبِ وَٱلۡمُشۡرِكِينَ فِي نَارِ جَهَنَّمَ خَٰلِدِينَ فِيهَآۚ أُوْلَٰٓئِكَ هُمۡ شَرُّ ٱلۡبَرِيَّةِ

٧-إِنَّ ٱلَّذِينَ ءَامَنُواْ وَعَمِلُواْ ٱلصَّٰلِحَٰتِ أُوْلَٰٓئِكَ هُمۡ خَيۡرُ ٱلۡبَرِيَّةِ

7-නියතව කවුරුන් විශ්වාසය කර යහපත් ක්‍රියාවන් කරන්නෝද එවැනි අය මැවුම්වලින් වඩාත් ශ්‍රේෂ්ඨ අය වේ.

٨-جَزَآؤُهُمۡ عِندَ رَبِّهِمۡ جَنَّٰتُ عَدۡنٖ تَجۡرِي مِن تَحۡتِهَا ٱلۡأَنۡهَٰرُ خَٰلِدِينَ فِيهَآ أَبَدٗاۖ رَّضِيَ ٱللَّهُ عَنۡهُمۡ وَرَضُواْ عَنۡهُۚ ذَٰلِكَ لِمَنۡ خَشِيَ رَبَّهُۥ

8-ඔවුන්ගේ හොඳ කුලිය, ඔවුන්ගේ ස්වාමියා හමුවෙහි ඇති “අද්නු” නම් ස්වර්ගයන්ය. ඒවායෙහි පහතින් ගංගා ගලා බසී. ඒවායෙහි ඔවුන් සදා රැඳී සිටින්නෝය. අල්ලාහ් ද ඔවුන් ගැන තෘප්ති වන්නේය. ඔවුන් -ද ඔහු ගැන තෘප්ති වන්නෝය. තම ස්වාමියාට කවරෙක් බියවන්නේද. එවැන්නාට මේ(ම උසස් තත්ව)ය ඇති වේ.

පරිච්ඡේදය : 99

## අල් සිල්සාල් - කම්පනය

වැකි : 8-මදනී

## ٩٩- سورة الزلزال

مدنية وهي ثماني آيات

بِسۡمِ ٱللَّهِ ٱلرَّحۡمَٰنِ ٱلرَّحِيمِ

**අසීමිත කරුණාවන්ත අසම දයාවන්ත අල්ලාහ්ගේ නාමයෙන් (ආරම්භ කරමි)**

١-إِذَا زُلۡزِلَتِ ٱلۡأَرۡضُ زِلۡزَالَهَا

1- භූමිය බලවත් කම්පනය ලෙස කම්පන වන කළ,

٢-وَأَخۡرَجَتِ ٱلۡأَرۡضُ أَثۡقَالَهَا

2- තවද භූමිය තම ඉසුලුම් බැහැර කරන කළ,

٣-وَقَالَ ٱلۡإِنسَٰنُ مَا لَهَا

3- "එයට කුමක් වූයේද?" යැයි මිනිසා අසන කළ,

٤-يَوۡمَئِذٖ تُحَدِّثُ أَخۡبَارَهَا

4- එදිනයෙහි එය තම පුවත් දන්වයි.

٥-بِأَنَّ رَبَّكَ أَوۡحَىٰ لَهَا

5- (එසේ දන්වන ලෙස) ඔබගේ ස්වාමියා එයට වහී* මගින් දැන්වූ නිසා,

٦-يَوۡمَئِذٖ يَصۡدُرُ ٱلنَّاسُ أَشۡتَاتٗا لِّيُرَوۡاْ أَعۡمَٰلَهُمۡ

6- එදිනයෙහි මිනිසුන් තමන්ගේ කාර්යයන් පෙන්වනු ලැබීම පිණිස බොහෝ කොටස් වශයෙන් වෙන්වී පැමිණෙන්නෝය.

٧-فَمَن يَعۡمَلۡ مِثۡقَالَ ذَرَّةٍ خَيۡرٗا يَرَهُۥ

7- එබැවින්. කවරෙක් පරමාණුවක තරම් යහකම් කළේද එය ඔහු දකින්නේය.

٨-وَمَن يَعۡمَلۡ مِثۡقَالَ ذَرَّةٖ شَرّٗا يَرَهُۥ

8- තවද කවරෙක් පරමාණුවක තරම් නපුරක් කළේද එයද ඔහු දකින්නේය

## පරිච්ඡේදය : 100
## අල් ආදියාත්-සීඝ්‍රයෙන් දුවන දේ
වැකි : 11- මක්කී

## ١٠٠- سورة العاديات
مكية وهي احدى عشرة آية

**අසීමිත කරුණාවන්ත අසම දයාවන්ත අල්ලාහ්ගේ නාමයෙන් (ආරම්භ කරමි)**

بِسْمِ ٱللَّهِ ٱلرَّحْمَٰنِ ٱلرَّحِيمِ

1-හති දමා සීඝ්‍රයෙන් දුවන දේ (වන අශ්වයන්) කෙරෙහි සත්‍ය වශයෙන්ම

١-وَٱلْعَٰدِيَٰتِ ضَبْحًا

2-පසුව (කුරය) ගසා ගිනි පිටකරවන දේ කෙරෙහි සත්‍ය වශයෙන්ම.

٢-فَٱلْمُورِيَٰتِ قَدْحًا

3-පසුව අළුයමෙහි සීඝ්‍රයෙන් (සතුරත් කරා) පනිමින් යන දේ කෙරෙහිද-

٣-فَٱلْمُغِيرَٰتِ صُبْحًا

4-තවද එමගින් දූවිල්ල අවුස්සන දේ කෙරෙහිද-

٤-فَأَثَرْنَ بِهِۦ نَقْعًا

5-පසුව (සතුරු සේනාව) මධ්‍යයේ කණ්ඩායම් ලෙස ඇතුළුවී යන දේ කෙරෙහිද සත්‍ය වශයෙන්ම.

٥-فَوَسَطْنَ بِهِۦ جَمْعًا

6-නියතව මිනිසා තම ස්වාමියාට ගුණ ජමකුව සිටී.

٦-إِنَّ ٱلْإِنسَٰنَ لِرَبِّهِۦ لَكَنُودٌ

7-තවද නියතව ඔහුම මෙයට සාක්ෂිය වශයෙන් සිටී.

٧-وَإِنَّهُۥ عَلَىٰ ذَٰلِكَ لَشَهِيدٌ

8-තවද නියතව ඔහු ද්‍රව්‍යයන් ප්‍රිය කිරීමෙහි දැඩි කෙනෙකුව සිටී.

٨-وَإِنَّهُۥ لِحُبِّ ٱلْخَيْرِ لَشَدِيدٌ

9-ඔහු නොදැනගත්තේද ? මිනීවළවල් වලින්. ඒවායෙහි ඇති දේ නැගිට්ටවු -වනු ලබන කළ-

٩-أَفَلَا يَعْلَمُ إِذَا بُعْثِرَ مَا فِى ٱلْقُبُورِ

10-තවද සිත්හි ඇති දේ ද බැහැර කරවන කළ-

١٠-وَحُصِّلَ مَا فِى ٱلصُّدُورِ

11-නියතව ඔවුන්ගේ ස්වාමියා ඔවුන් ගැන එදිනයෙහි හොඳින් හඳුනන් -නාය. (එහෙයින් යහපතට හොඳ කුලියද අයහපතට දඬුවමද දෙන් -නේය)

١١-إِنَّ رَبَّهُم بِهِمْ يَوْمَئِذٍ لَّخَبِيرٌۢ

## පරිච්ඡේදය : 101- අල් කාරිආ
## තිගැස්සීමට පත්කරවන සිදුවීම
වැකි : 11- මක්කී

## ١٠١- سورة القارعة
مكية وهي احدى عشرة آية

**අසීමිත කරුණාවන්ත අසම දයාවන්ත අල්ලාහ්ගේ නාමයෙන් (ආරම්භ කරමි)**

بِسْمِ اللَّهِ الرَّحْمَنِ الرَّحِيمِ

1-තිගැස්සීමට පත් කරවන (සිදුවීම)

١-ٱلْقَارِعَةُ

2-තිගැස්සීමට පත් කරවන (සිදුවීම) යනු කුමක්ද?

٢-مَا ٱلْقَارِعَةُ

3-තිගැස්සීමට පත් කරවන (සිදුවීම) යනු කුමක්දැයි ඔබට දැන්වූයේ කුමක්ද ?

٣-وَمَآ أَدْرَىٰكَ مَا ٱلْقَارِعَةُ

4-මිනිසුන් එදිනයෙහි සිසිකඩවූ ඉපියන් මෙන් වන්නෝය.

٤-يَوْمَ يَكُونُ ٱلنَّاسُ كَٱلْفَرَاشِ ٱلْمَبْثُوثِ

5-තවද කඳු බිම හෙළනලද පුළුන් මෙන් වන්නේය.

٥-وَتَكُونُ ٱلْجِبَالُ كَٱلْعِهْنِ ٱلْمَنفُوشِ

6-එබැවින් (එදින) කවරෙකුගේ (යහ කම්හි) කිරුම බරවූයේද-

٦-فَأَمَّا مَن ثَقُلَتْ مَوَٰزِينُهُۥ

7-ඔහු තෘප්තිමත් වූ ජීවනයෙහි පසු -වෙයි.

٧-فَهُوَ فِى عِيشَةٍ رَّاضِيَةٍ

8-නමුත් කවරෙකුගේ (යහකම්හි) කිරුම සැහැල්ලුවූයේද-

٨-وَأَمَّا مَنْ خَفَّتْ مَوَٰزِينُهُۥ

9-ඔහුගේ නවාතැන හාවියා ය.

٩-فَأُمُّهُۥ هَاوِيَةٌ

10-තවද (හාවියාවූ) එය කුමක් යන්න ඔබට දැන්වූයේ කුමක්ද ?

١٠-وَمَآ أَدْرَىٰكَ مَا هِيَهْ

11-එය (නිරයේ) දවාලන ගිනි අගලය.

١١-نَارٌ حَامِيَةٌ

| | |
|---|---|
| පරිච්ඡේදය : 102<br>**අත්තකාසුර් - තන්හාව**<br>වැකි : 8- මක්කී | **١٠٢- سورة التكاثر**<br>**مكية وهي ثماني آيات** |

| | |
|---|---|
| **අසීමිත කරුණාවන්ත අසම දයාවන්ත අල්ලාහ්ගේ නාමයෙන් (ආරම්භ කරමි)** | بِسْمِ ٱللَّهِ ٱلرَّحْمَٰنِ ٱلرَّحِيمِ |
| 1-සම්පත් වැඩිකර ගැනීමේ තන්හාව ඔබලාව (අල්ලාහ් කෙරෙන්) උදාසීන කළේය. | ١-أَلْهَىٰكُمُ ٱلتَّكَاثُرُ |
| 2-ඔබලා මිනීවලවල් මුණ ගැසෙනා තෙක්, | ٢-حَتَّىٰ زُرْتُمُ ٱلْمَقَابِرَ |
| 3-එසේ නොව: ඉතා ඉක්මනින් (එහි ප්‍රතිඵලය) ඔබලා දැනගන්නෙහුය. | ٣-كَلَّا سَوْفَ تَعْلَمُونَ |
| 4-පසුව එසේනොව: ඉතා ඉක්මනින් (එහි ප්‍රතිඵලය) ඔබලා දැනගන් -නෙහුය. | ٤-ثُمَّ كَلَّا سَوْفَ تَعْلَمُونَ |
| 5-එසේනොව, ස්ථිර දැනුමෙන් ඔබලා දැනගන්නෙහු නම් (එම තන්හාව ඔබලාව උදාසීණ නොකරන්නේය) | ٥-كَلَّا لَوْ تَعْلَمُونَ عِلْمَ ٱلْيَقِينِ |
| 6-නියතව. (එම තන්හාව හේතුකොට ගෙන) ඔබලා නිරය බලන්නෙහුය. | ٦-لَتَرَوُنَّ ٱلْجَحِيمَ |
| 7-පසුව ඔබලා එය ස්ථිරව ඇසින් බලන්නෙහුය. | ٧-ثُمَّ لَتَرَوُنَّهَا عَيْنَ ٱلْيَقِينِ |
| 8-පසුව එදින (මෙලොවෙහි ඔබලා හට පිරිනමන ලද) අනුග්‍රහයන් පිළි බඳව නියතව ඔබලා විමසනු ලබන් -නෙහුය. | ٨-ثُمَّ لَتُسْـَٔلُنَّ يَوْمَئِذٍ عَنِ ٱلنَّعِيمِ |

| | |
|---|---|
| පරිච්ඡේදය : 103<br>**අල් අස්ර් - කාළය**<br>වැකි : 3- මක්කී | **١٠٣- سورة العصر**<br>**مكية وهي ثلاث آيات** |

**අසීමිත කරුණාවන්ත අසම දයාවන්ත අල්ලාහ්ගේ නාමයෙන් (ආරම්භ කරමි)**

بِسْمِ اللَّهِ الرَّحْمَٰنِ الرَّحِيمِ

1-කාළය කෙරෙහි සත්‍ය වශයෙන්ම.

١-وَٱلۡعَصۡرِ

2-නියතව. මිනිසා පාඩුවෙහි සිටී.

٢-إِنَّ ٱلۡإِنسَٰنَ لَفِى خُسۡرٍ

3-නමුත් කවුරුන් විශ්වාස කර, යහ කම් කර සත්‍යය මගින් පරස්පර උපදෙස් කර, තවද ඉවසීම මගින්ද උපදෙස් කරන්නන් වන ඔවුන් හැරය.

٣-إِلَّا ٱلَّذِينَ ءَامَنُواْ وَعَمِلُواْ
ٱلصَّٰلِحَٰتِ وَتَوَاصَوۡاْ بِٱلۡحَقِّ
وَتَوَاصَوۡاْ بِٱلصَّبۡرِ

| පරිච්ඡේදය : 104<br>අල් හුමසා – කේලම් කීම<br>වැකි : 9- මක්කී | ١٠٤- سورة الهمزة<br>مكية وهي تسع آيات |
| --- | --- |

**අසීමිත කරුණාවන්ත අසම දයාවන්ත අල්ලාහ්ගේ නාමයෙන් (ආරම්භ කරමි)**

بِسْمِ اللَّهِ الرَّحْمَٰنِ الرَّحِيمِ

1-දෝෂා කර, කේලම් කියමින් සිටින සැමොටම විපතය.

١-وَيْلٌ لِّكُلِّ هُمَزَةٍ لُّمَزَةٍ

2-මෙවැන්නා සම්පත් එක්රැස් කර ගණන් කරමින් සිටි.

٢-ٱلَّذِى جَمَعَ مَالاً وَعَدَّدَهُۥ

3-නියතව තම සම්පත් තමාව (මෙලොවෙහි) කවදත් ස්ථිරව තබන්නේ යැයි ඔහු සිතයි.

٣-يَحْسَبُ أَنَّ مَالَهُۥٓ أَخْلَدَهُۥ

4-එසේ නොව: නියතව ඔහු "හුතමා" වෙහි විසිකරවනු ලබන්නේය.

٤-كَلَّا لَيُنۢبَذَنَّ فِى ٱلْحُطَمَةِ

5-හුතමා කුමක් යන්න ඔබට දැන්වූයේ කුමක්ද ?

٥-وَمَآ أَدْرَىٰكَ مَا ٱلْحُطَمَةُ

6-එය දැල්වෙමින් පවතින අල්ලාහ්ගේ ගින්නය.

٦-نَارُ ٱللَّهِ ٱلْمُوقَدَةُ

7-එය (ශරීරය ස්පර්ශවූ කළ) හදවත් තුළට පතින්නේය.

٧-ٱلَّتِى تَطَّلِعُ عَلَى ٱلْأَفْـِٔدَةِ

8-නියතව. එය ඔවුන්ව වට කරමින් මොළවනු ලබයි.

٨-إِنَّهَا عَلَيْهِم مُّؤْصَدَةٌ

9-දිග කණුවල (ඔවුන් බඳවනු ලැබුවන් ලෙස)

٩-فِى عَمَدٍ مُّمَدَّدَةٍ

| පරිච්ඡේදය : 105<br>අල් ෆීල් - අලියා<br>වැකි : 5- මක්කී | ١٠٥- سورة الفيل<br>مكية وهي خمس آيات |
|---|---|

**අසීමිත කරුණාවන්ත අසම දයාවන්ත අල්ලාහ්ගේ නාමයෙන් (ආරම්භ කරමි)**

بِسْمِ اللَّهِ الرَّحْمَٰنِ الرَّحِيمِ

1-(නබි!) අලි (සේනා) කරුවන්ව ඔබ -ගේ ස්වාමියා කුමක් කළේද යන්න ඔබ (සිතා) නොබැලුවෙහිද ?

١-أَلَمْ تَرَ كَيْفَ فَعَلَ رَبُّكَ بِأَصْحَٰبِ ٱلْفِيلِ

2-ඔවුන්ගේ කුමන්ත්‍රණය ඔහු (විනාශ කර) මං මුළාවෙහි යැව්වේ නැද්ද ?

٢-أَلَمْ يَجْعَلْ كَيْدَهُمْ فِي تَضْلِيلٍ

3-තවද ඔවුන් කෙරෙහි පක්ෂීන් කණ්ඩායම් වශයෙන් ඔහු යැව්වේය.

٣-وَأَرْسَلَ عَلَيْهِمْ طَيْرًا أَبَابِيلَ

4-රත් කරන ලද කුඩා ගල් ඔවුන් මත ඒවා වීසි කළේය.

٤-تَرْمِيهِم بِحِجَارَةٍ مِّن سِجِّيلٍ

5-එමගින් ඔවුන්ව අනුභව කරන ලද පිදුරු මෙන් ඔහු කළේය.

٥-فَجَعَلَهُمْ كَعَصْفٍ مَّأْكُولٍ

| | |
|---|---|
| පරිච්ඡේදය : 106<br>**කුරෙෂ් - කුරෙෂිවරුන්**<br>වැකි : 4- මක්කී | **١٠٦- سورة قريش**<br>**مكية وهي أربع آيات** |

**අසීමිත කරුණාවන්ත අසම දයාවන්ත අල්ලාහ්ගේ නාමයෙන් (ආරම්භ කරමි)**

بِسْمِ ٱللَّهِ ٱلرَّحْمَٰنِ ٱلرَّحِيمِ

1-කුරෙෂිවරුනට ප්‍රිය ඇති කර,

١-لِإِيلَٰفِ قُرَيْشٍ

2-ශීත කාලයේදී ද, ග්‍රීස්ම කාලයේදී ද ගමනෙහි ඔවුනට සිත් සැණසීම ඇති කළ හේතුවෙන්-

٢-إِۦلَٰفِهِمْ رِحْلَةَ ٱلشِّتَآءِ وَٱلصَّيْفِ

3-(කඃබාව වූ) මෙම නිවසෙහි ස්වාමි -යාව ඔවුන් නැමදුම් කළාවේ.

٣-فَلْيَعْبُدُوا۟ رَبَّ هَٰذَا ٱلْبَيْتِ

4-ඔහු ඔවුනට කුසගින්නට ආහාර පාන පිරිනැමුවේය. තවද ඔවුන්ව බියෙන් ආරක්ෂා කළේය.

٤-ٱلَّذِىٓ أَطْعَمَهُم مِّن جُوعٍ وَءَامَنَهُم مِّنْ خَوْفٍۭ

## පරිච්ඡේදය : 107
## අල් මාඌන් – අල්ප වස්තූන්
වැකි : 7- මක්කී

## ١٠٧- سورة الماعون
مكية وهي سبع آيات

**අසීමිත කරුණාවන්ත අසම දයාවන්ත අල්ලාහ්ගේ නාමයෙන් (ආරම්භ කරමි)**

بِسْمِ اللَّهِ الرَّحْمَٰنِ الرَّحِيمِ

1-(නබි!) විනිශ්ච දිනය බොරු කරන් -නාව ඔබ දුටුවෙහිද ?

١-أَرَءَيْتَ ٱلَّذِى يُكَذِّبُ بِٱلدِّينِ

2-අනාථයිත්ව එළවන්නේ ඔහුමය.

٢-فَذَٰلِكَ ٱلَّذِى يَدُعُّ ٱلْيَتِيمَ

3-තවද දුගියන්ට ආහාරපාන පිරිනැමී -මෙහිද ඔහු දිරි නොගන්වයි.

٣-وَلَا يَحُضُّ عَلَىٰ طَعَامِ ٱلْمِسْكِينِ

4-තවද (නොසැලකිලිමත්ව) සලාතය ඉටු කරන්නන්ට විපතමය.

٤-فَوَيْلٌ لِّلْمُصَلِّينَ

5-ඔවුන් කවුරුන්දනම් තම සලාතයෙහි නොසැලකිලිමත්ව සිටින්නන්ය.

٥-ٱلَّذِينَ هُمْ عَن صَلَاتِهِمْ سَاهُونَ

6-ඔවුන් අන් අයට පෙන්ව(න්නට සලා -තය කර)න්නෝය.

٦-ٱلَّذِينَ هُمْ يُرَآءُونَ

7-තවද (භාවිතයේ ඇති) අල්ප වස්තූන් (දීමෙන්) බාධා කරන්නෝය.

٧-وَيَمْنَعُونَ ٱلْمَاعُونَ

පරිච්ඡේදය : 108
## අල්කව්සර් - අසීමිත සම්පත්
වැකි : 3- මක්කී

١٠٨- سورة الكوثر
مكية وهي ثلاث آيات

**අසීමිත කරුණාවන්ත අසම දයාවන්ත අල්ලාහ්ගේ නාමයෙන් (ආරම්භ කරමි)**

بِسْمِ اللَّهِ الرَّحْمَٰنِ الرَّحِيمِ

1-(නබි!) නියතව අප (අසීමිත යහපත් වන) "කව්සරය" ඔබට දුනිමු.

١-إِنَّآ أَعْطَيْنَـٰكَ ٱلْكَوْثَرَ

2-එබැවින් ඔබගේ ස්වාමියාට සලාතය කර, කුර්බානිය* (නම් සිවුපාවන් කැපකිරීම) ද ඔබ කරන්න!

٢-فَصَلِّ لِرَبِّكَ وَٱنْحَرْ

3-නියතව ඔබගේ සතුරා (කවරෙක් ද) ඔහුය, පෙළපත නැති කෙනාය.

٣- إِنَّ شَانِئَكَ هُوَ ٱلْأَبْتَرُ

| | |
|---|---|
| පරිච්ඡේදය : 109<br>අල්කාෆිරූන්-ප්‍රතික්ෂේප කරන්නන්<br>වැකි : 6- මක්කී | ١٠٩- سورة الكافرون<br>مكية وهي ست آيات |

**අසීමිත කරුණාවන්ත අසම දයාවන්ත අල්ලාහ්ගේ නාමයෙන් (ආරම්භ කරමි)**

بِسْمِ اللَّهِ الرَّحْمَٰنِ الرَّحِيمِ

1-(නබි) ඔබ කියන්න: ඕ! ප්‍රතික්ෂේප කරන්නෙනි!

١-قُلْ يَٰٓأَيُّهَا ٱلْكَٰفِرُونَ

2-ඔබලා නැමදුම් කරන දෙය මා නැමදුම් නොකරමි.

٢-لَآ أَعْبُدُ مَا تَعْبُدُونَ

3-තවද මා නැමදුම් කරන්නාව ඔබලා නැමදුම් කරන්නන් නොවේ.

٣-وَلَآ أَنتُمْ عَٰبِدُونَ مَآ أَعْبُدُ

4-තවද ඔබලා නැමදුම් කරන දෙය මා නැමදුම් කරන්නා නොවේ.

٤-وَلَآ أَنَا۠ عَابِدٌ مَّا عَبَدتُّمْ

5-තවද මා නැමදුම් කරන්නාව ඔබලා නැමදුම් කරන්නන් නොවේ.

٥-وَلَآ أَنتُمْ عَٰبِدُونَ مَآ أَعْبُدُ

6-ඔබලාට ඔබලාගේ මාර්ගය මාහට මාගේ මාර්ගය

٦-لَكُمْ دِينُكُمْ وَلِيَ دِينِ

| | |
|---|---|
| පරිච්ඡේදය : 110<br>**අල් නස්ර් - උපකාරය**<br>වැකි : 3- මදනී | ١١٠- سورة النصر<br>مدنية وهي ثلاث آيات |

**අසීමිත කරුණාවන්ත අසම දයාවන්ත අල්ලාහ්ගේ නාමයෙන් (ආරම්භ කරමි)**

بِسْمِ ٱللَّهِ ٱلرَّحْمَٰنِ ٱلرَّحِيمِ

1-අල්ලාහ්ගේ උපකාරයද, ජයග්‍රහනය ද පැමිණෙන කල-

١-إِذَا جَآءَ نَصْرُ ٱللَّهِ وَٱلْفَتْحُ

2-තවද අල්ලාහ්ගේ මාර්ගයෙහි මිනිසුන් කණ්ඩායම් වශයෙන් පිවිසීම ඔබ දකින කළද-

٢-وَرَأَيْتَ ٱلنَّاسَ يَدْخُلُونَ فِى دِينِ ٱللَّهِ أَفْوَاجًا

3-ඔබගේ ස්වාමියාගේ ප්‍රසංශාව මගින් සුවි ශුද්ධ කරන්න! තවද ඔහුගෙන් සමාව අයදින්න. නියතව. ඔහු පසු -තැවිලි වීම භාරගන්නාව සිටී.

٣-فَسَبِّحْ بِحَمْدِ رَبِّكَ وَٱسْتَغْفِرْهُ إِنَّهُۥ كَانَ تَوَّابًا

පරිච්ඡේදය : 111
## අල්මසද්-ඉඳිපටවලින් යුත් කඹය
වැකි : 5- මක්කී

## ١١١- سورة المسد
مكية وهي خمس آيات

**අසීමිත කරුණාවන්ත අසම දයාවන්ත අල්ලාහ්ගේ නාමයෙන් (ආරම්භ කරමි)**

بِسْمِ اللَّهِ الرَّحْمَٰنِ الرَّحِيمِ

1-අබූලහබ්ගේ දෑත් වැනසේවා! ඔහුද වැනසේවා!

١-تَبَّتْ يَدَآ أَبِى لَهَبٍ وَتَبَّ

2-ඔහුගේ සම්පත්ද, ඔහු උපයාගත් දේ ද ඔහුට ඵලක් නොවීය.

٢-مَآ أَغْنَىٰ عَنْهُ مَالُهُۥ وَمَا كَسَبَ

3-ඉතා ඉක්මනින් ඔහු දළුලන ගින් - නෙහි ඇතුළු වන්නේය.

٣-سَيَصْلَىٰ نَارًا ذَاتَ لَهَبٍ

4-දර උසුලන ඔහුගේ බිරියද-

٤-وَٱمْرَأَتُهُۥ حَمَّالَةَ ٱلْحَطَبِ

5-ඇගේ ගෙලෙහි දගවැටුනු ඉඳි (පට -වලින් යුත්) කඹය වේ. (එමගින් ඇයද විනාශවන්නාය.)

٥-فِى جِيدِهَا حَبْلٌ مِّن مَّسَدٍۭ

## ١١٢- سورة الإخلاص

**مكية وهي أربع آيات**

## පරිච්ඡේදය : 112

## අල් ඉඛ්ලාස්-පිරිසිදු චේතනාව

**වැකි : 4- මක්කී**

بِسۡمِ ٱللَّهِ ٱلرَّحۡمَٰنِ ٱلرَّحِيمِ

**අසීමිත කරුණාවන්ත අසම දයාවන්ත අල්ලාහ්ගේ නාමයෙන් (ආරම්භ කරමි)**

١-قُلۡ هُوَ ٱللَّهُ أَحَدٌ

1-(නබි!) ඔබ පවසන්න: ඔහු- අල්ලාහ් එක්කෙනෙකි.

٢-ٱللَّهُ ٱلصَّمَدُ

2-අල්ලාහ් අවශ්‍යතාවයන්ගෙන් තොර වූ කෙනෙකි.

٣-لَمۡ يَلِدۡ وَلَمۡ يُولَدۡ

3-ඔහුට දාව කිසිකෙනෙකු ඉපදුනේ නැත; ඔහු කිසිවෙකුට දාව ඉපදු - නේද නැත.

٤-وَلَمۡ يَكُن لَّهُۥ كُفُوًا أَحَدُۢ

4-තවද ඔහුට සමාන කිසිවෙකු නැත.

## පරිච්ඡේදය : 113
## අල් ෆලක් - අරුණෝදය
### වැකි : 5- මක්කී

## ١١٣- سورة الفلق
### مكية وهي خمس آيات

**අසීමිත කරුණාවන්ත අසම දයාවන්ත අල්ලාහ්ගේ නාමයෙන් (ආරම්භ කරමි)**

بِسْمِ ٱللَّهِ ٱلرَّحْمَٰنِ ٱلرَّحِيمِ

1-(නබි!) ඔබ කියන්න: අරුණෝදයෙහි ස්වාමියාගෙන් මා ආරක්ෂාව පතන්නෙමි.

2-ඔහු නිර්මාණය කළ දෙයෙහි හානියෙන්-

3-අන්ධකාරය පැතිරෙන කළ ඇතිවන හානියෙන්ද-

4-තවද, ගැටවල පිඹින ස්ත්‍රීන්ගේ හානියෙන්ද-

5-ඊර්ෂ්‍යා කරන්නා, ඊර්ෂ්‍යා කරන කළ ඇතිවන හානියෙන්ද (ආරක්ෂාව පතන්නෙමි.)

١-قُلْ أَعُوذُ بِرَبِّ ٱلْفَلَقِ

٢-مِن شَرِّ مَا خَلَقَ

٣-وَمِن شَرِّ غَاسِقٍ إِذَا وَقَبَ

٤-وَمِن شَرِّ ٱلنَّفَّٰثَٰتِ فِى ٱلْعُقَدِ

٥-وَمِن شَرِّ حَاسِدٍ إِذَا حَسَدَ

| පරිච්ඡේදය : 114<br>**අන්නාස් - මිනිසුන්**<br>වැකි : 6- මක්කී | **١١٤- سورة الناس**<br>**مكية وهي ست آيات** |
|---|---|

**අසීමිත කරුණාවන්ත අසම දයාවන්ත අල්ලාහ්ගේ නාමයෙන් (ආරම්භ කරමි)**

بِسْمِ اللَّهِ الرَّحْمَٰنِ الرَّحِيمِ

1-(නබි!) ඔබ පවසන්න: මිනිසුන්ගේ ස්වාමියාගෙන් මා ආරක්පාව පතන් -නෙමි.

١-قُلْ أَعُوذُ بِرَبِّ ٱلنَّاسِ

2-මිනිසුන්ගේ අධිපති (ඔහුය.)

٢-مَلِكِ ٱلنَّاسِ

3-මිනිසුන්ගේ නැමදුමට සුදුස්සා (ඔහු -මය.)

٣-إِلَٰهِ ٱلنَّاسِ

4-සැඟවී සිට තිප්පල සැක ඇති කරන්නා (වන ෂෙයිතාන්)ගේ හාණි යෙන්ද (ස්වාමියාගෙන් ආරක්පාව පතමි)

٤-مِن شَرِّ ٱلْوَسْوَاسِ ٱلْخَنَّاسِ

5-මොහු මිනිසුන්ගේ සිත්හි තිප්පල සැක ඇති කරයි.

٥-ٱلَّذِى يُوَسْوِسُ فِى صُدُورِ ٱلنَّاسِ

6-(මෙවැන්නන්) ජින්වරුන්ගෙන්ද. මිනිසුන් ගෙන්ද ඇත.

٦-مِنَ ٱلْجِنَّةِ وَٱلنَّاسِ

## සටහන :

- ස්වාමියා : "රබ්" යන අරාබි වචනය: මැවුම්කරු, අයිතිකරු, පාලනය කරන්නා, සපයන්නා, ස්වාමියා, සැලසුම් කරන්නා, ආදරයෙන් රැක බලාගන්නා, උසුලා ගෙන සිටින්නා, ආරක්පාව ලබා දෙන්නා යන අරුත් ගෙන දේ. එහෙයින් මෙහිදී වඩාත් උචිතම වචනය වූ ස්වාමියා යන්න "රබ්" යන වචනය වෙනුවට යොදා ඇත.
- ඇතිරිල්ල : මිනිසා වාසය කිරීමට සුදුසු තැනක් ලෙස
- සලාතය : අල්ලාහ්ව සිහි කරනු පිණිස මුස්ලිම් වරයෙකු විසින් කරනු ලබන නැමදීමකි
- අලක් : මෙම අරාබි වචනය: ලෙය, එල්ලෙමින් පවතින දෙයක්, කඩැල්ලා යන අරුත් ගෙන දේ
- සුජූද් : මුස්ලිම්වරයෙක් සලාතය ඉටු කරන කල නලල පොලොව මත නබා අල්ලාහ්ට තමාගේ පහත් භාවය පෙන්වීම.
- වහී : අල්ලාහ්ගේ දැනුම් දීම යන අර්ථය ගෙන දේ.
- සකාතය : නියමිත ගණනක් ඉක්මවූ ධනවත් මුස්ලිම්වර යෙක් නියමිත කාලය සම්පූර්ණවීමෙන් පසුව ගෙවන දෙය වේ.
- කුර්බානිය : අල්ලාහ්ගේ නම පවසා සතෙකුගේ බෙලි කැපීමෙන් පසුව දන් දීම වේ.
- මක්කී : නබිනායක මුහම්මදු (සල්) තුමා මක්කාවෙහි ගත කළ කාලයේ පහළවූ වැකි මෙසේ හැඳින් වේ.
- මදනී : නබිනායක මුහම්මදු (සල්) තුමා මදීනාවෙහි ගත කළ කාලයේ පහළවූ වැකි මෙසේ හැඳින් වේ